# 2023.01.03 මහා සභා රැස්වීම් වාර්තාව

## රැස්වීම සඳහා සහභාගී වූ ගරු මන්ත්‍රීවරුන්

01.ප්‍රාදේශීය සභා ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා
02.ප්‍රාදේශීය සභා ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා
03.ප්‍රාදේශීය ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා
04.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා
05.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම්. ජාබීර් මහතා
06. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා
07. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල් .ඒ.විරාජ් මධුසංක විජේසිංහ මහතා
08.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඩී. නිමාලි දිල්හානි මෙනවිය
09.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා
10. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.කී.එම්.ඉන්දික ප්‍රදීප් රාජගුරු මහතා
11.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඒ.චමින්ද ප්‍රදී මල්ලවආරච්චි මහතා
12.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ජයන්ත හේරත් මහතා
13.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා
14.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ප්‍රදීප් සුජීව හේරත් මහතා
15. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා
16.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.අමරසිංහ මහතා
17.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එන්.ජී.සුනිල් බණ්ඩාර හපුගම්මන මහතා
18.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි. සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය
19. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.කමල්සිරි මහතා
20.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි.ඒ.බංඩාරමැණිකා මහත්මිය
21.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය
22. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි එල්.එම්.ගුණරත්මැණිකා මහත්මිය
23. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඩී.මනෝ කුමාර එදිරිසිංහ මහතා
24.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය
25.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි බී.එම්.ගීතා කුමාරි බාලසූරිය මහත්මිය
26. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ජී.විරාජ් මලින්ද ඩයස් මහතා
27.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.ආර්.එම්.අපර්ණ නිලුපුල් සේනාරත්න මහතා
28.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා
29.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි එච්.එම්.උදේශිකා මාධවී හේරත් මහත්මිය
30.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා
31.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එම්. පයිසර් මහතා
32. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා
33.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී.රංජිත් ප්‍රේමලාල් මහතා
34.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.අජිත් චන්ද්‍රරත්න මහතා

**<u>රැස්වීම සඳහා සහභාගි නොවූ ගරු මන්ත්‍රීවරුන්</u>**

01.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.එම්.ප්‍රදීප් සමන් කුමාරසිරි තෙන්නකෝන් මහතා
02.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා
03. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා
04. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි ඒ.පී.සචින්තා අමාලි මෙනවිය

**ආගම සිහි කිරීම.**

ප්‍රථමයෙන් ජාතික ගීය වාදනය, ආගම සිහිකිරීමෙන් අනතුරුව මිය ගිය රණවිරුවන් සිහිකර ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව.10.00 ට පමණ ගරු සභාවේ කටයුතු න්‍යාය පත්‍රානුකූලව ආරම්භ කරන ලදී.2023 ජනවාරි මස මහා සභා රැස්වීමට සහභාගි වන ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී මණ්ඩලය ,ලේකම් ඇතුළු කාර්ය මණ්ඩල නිලධාරීන්, මාධ්‍යවේදීන් ඇතුළු සහභාගි වී සිටින සියලු දෙනාට ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා 2023 වර්ෂය ඉතාම සෞභාග්‍යය සම්පන්න වාසනාවන්ත නිදුක් නිරෝගී සුභ නව වසරක් හා සුභ උදෑසනක් ප්‍රාර්ථනා කරන ලද අතර සියලු දෙනාම ගෞරවයෙන් පිළිගන්නා ලදී.

## 01.පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.

## I. 2022.12.13 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව සම්මත කිරීම.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

න්‍යාය පත්‍රයේ වැඩ ආරම්භ කිරීමට මත්තෙන්, ඔබතුමන්ලා ට අද විශේෂ දවසක්.අපේ සභා රැස්වීම සිරිත් පරිදි පවත්වන දිනය ෙවනස් කරලා ජනවාරි මස 03 වැනිදා මහා සභා රැස්වීම පැවැත්වීමට කමිටුව තීරණය කළා. ඒ තීරණය අනුව ජනවාරි මස 03 මාසික රැස්වීම පැවැත්වීමට තීරණය කළා. න්‍යාය පත්‍රයට අනුව වැඩ ආරම්භ කරමු. ඒ අනුව 2022.12.13 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාවේ අඩුපාඩු ඇත්නම් එය පෙන්වා දෙන ලෙසත් , එසේ නොමැති නම් පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කරන ලෙසත් දන්වා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී එල්.එම්.ගුණරත්මැණිකා මහත්මිය - (එ.ජා.ප.)</u>**

සියලුදෙනාටම නිදුක් නිරෝගී වාසනාවන්ත සුබ අලුත් අවුරුද්දක් වේවායි ප්‍රාර්ථනා කරනවා.2022.12.13 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එම්.පයිසර් මහතා - (ශ්‍රී ල.මු.කො.)</u>**

2022.12.13 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>සංශෝධන 01</u>**

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා - (ජ.වි.පෙ.)</u>**

සියලුදෙනාටම සුබ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරමින්,සභා වාර්තාවේ 07වැනි පිටුවේ සඳහන් වන මගේ ප්‍රකාශයේ දෝෂ කිහිපයක් සංශෝධනය කරන්න කැමතියි. ගරු සභාපතිතුමනි, සභා වාර්තාවක් සංක්ෂිප්ත කරන්න යද්දී සිදුවෙන ගැටලු මේ. එකිනෙකට නොගැලපීම් වැනි දේවල් සිදුවෙන්න පුළුවන්. සභා වාර්තාවේ ඇතුළත් වෙනවා මෙන්න මෙහෙම. ඔබතුමා ගෙනාපු යෝජනාව ඇතුලේ තිබුණේ හෙට්ටිපොල මහජන ක්‍රීඩාංගනය බදු ලබාදීම යෝජනාව කියලා විතරයි. නමුත් නිමල් දයානන්ද මන්ත්‍රීතුමාගේ කථාවේ කියවුනේ මේක බදු ගන්නේ ක්‍රිකට් බෝර්ඩ් එකෙන් කියලා. සභාපති තුමා කියනවා මේක ගන්නේ ක්‍රිකට් ඇසෝසියේෂන් කියලා. එතකොට මේක ඉල්ලීමක් මත තමයි මේක දෙන්න හදන්නේ. **"එතකොට මේකේ සියලු වියදම් වෙන් කලේ නිමල් දයානන්ද මන්ත්‍රීතුමා."** මම එහෙම කතාවක් කියලා නෑ.එය සංශෝධනය විය යුතුයි.

නමුත් ඔබතුමාට යෝජනාව ඉදිරිපත් කරද්දි වගකීමක් තියෙනවා ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන්න. එතකොට තමයි මේ ක්‍රීඩාංගනය බදු දීම ගැන අපිට අදහසක් එන්නේ. නිමල් දයානන්ද මන්ත්‍රිතුමා කීවා තක්සේරු කරන්න දුන්නහම අවුරුදු දෙක තුනක් යයි තක්සේරුව එන්න අපි කමිටුවක් දාලා මේක පිළියෙලක් කරමු කියලා එකක්. ඒකේ ප්‍රශ්නයක් තියනවා මොකද කලින් මෙහෙම කලබලයක් තිබුනේ නැති නිසා. දැන් මෙය පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව මඟින් පාලනය කරන මහජන ක්‍රීඩාංගනයක් බැවින් මෙහි ආදායම් ලැබෙනවානම් ලැබෙන්නේ පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවටයි. **"ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ තිබුන ක්‍රීඩා පිටිය නැවතත් සභාවට පවරලා තියෙන්නේ."** මම එහෙම කීවෙත් නෑ**. ක්‍රීඩා අමාත්‍යාංශය මඟින් සංවර්ධනය කරපු ක්‍රීඩා පිටිය නැවතත් සභාවට භාර දීලා තියෙන්නේ** කියලා එය සංශෝධනය විය යුතුයි.

ඊළඟට මෙහි පැහැදිලි කිරීමකින් පසුව **"සාධනියකරණයකින්"** පසුව කියන තැන **සාධනීය කරුණකින්** පසුව කියලා නිවැරදි විය යුතුයි. මීළඟට සභා වාර්තාවේ 11 වැනි පිටුවේ තිබෙනවා ප්‍රකාශයක්. ඒක වෙන කෙනෙක්ගේ ප්‍රකාශයක් නමුත් මගේ නමින් දාලා තිබෙන්නේ.එය සංශෝධනය විය යුතුයි.

**<u>"ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා - (පො.ජ.පෙ.)</u>**

**ජයන්ත මන්ත්‍රීතුමා දිගින් දිගටම කථාකලා ජාත්‍යාන්තර තලයේ ක්‍රීඩාංගනයක් ඉදිවුනාම ග්‍රාමීය ක්‍රීඩකයින්ට මොකක්ද වෙන්නේ කියලා. උදාහරණයක් ලෙස අපේ හෙට්ටිපොල නගරයේ වෙළඳුන්ට ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ වෙළඳාම් කරන්න බෑ. අපේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අසාධාරණයක් නොවෙන්න සැලසුමක් හදලා මෙය දිය යුතුයි. මෙය අපි තව කාලයක් නඩත්තු කලොත් අහිංසක මිනිසුන්ගේ බදු මුදලින් තමයි වියදම් කරන්න වෙන්නේ. අපි අවුරුදු 5ක් 6ක් මහන්සි වෙලා මේ ක්‍රීඩාපිටිය හදලා බාර දිලා මාස කීපයකින් තමයි මේ යෝජනාවලිය එන්නේ. මේ යෝජනාවලිය ඇතුලේ පෞද්ගලිකව අන්තර්ගතය තියනවා කියලා තමයි මං විස්වාස කරන්නේ.ක්‍රිකට් ක්ලබ් එකක් නැතුව මේ ක්‍රීඩාපිටිය නඩත්තු කරන්න බෑ. අපි සියලු දෙනා කථා කරලා මන්ත්‍රීවරුන්ටවත්, සභාවටවත්, අපේ අනන්‍යතාවයටවත්, ප්‍රදේශයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ටවත් ගැටළුවක් නොවෙන්න නිමල් මන්ත්‍රීතුමා සඳහන් කල පරිදි අවුරුද්දක කාලයකට අපේ කොන්දේසිවලට එකඟ නම් බදු දෙන්න වැඩපිළිවෙලක් යොදමු."**

අනිත් ගැටළුව තමා ගරු සභාපතිතුමනි, 11 වැනි පිටුවෙන් පසුව 12 වැනි පිටුව නොමැතිවීම.එය මුද්‍රණ දෝෂයක් විය හැකියි.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

ඒ අනුව ඉහත සංශෝධනයට යටත්ව 2022 දෙසැම්බර් 13 දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව ගරු සභාවේ සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022 දෙසැම්බර් 13 දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව ගරු සභාවේ සභා සම්මත විය.**

## 02.සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන.

## I.කොහු සහ කොහුබත් ආශ්‍රිත කර්මාන්තයේ කඩා වැටීම සම්බන්ධව.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

කොහු සහ කොහුබත් ආශ්‍රිත කර්මාන්තයේ කඩා වැටීම සම්බන්ධව විශේෂ යෝජනාවක් ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල්.ඒ.විරාජ් මධුසංක විජේසිංහ මහතා ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා.එම යෝජනාව විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සඳහා යෝජනා ස්ථිර කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල්.ඒ.විරාජ් මධුසංක විජේසිංහ මහතා - (එ.ජ.නි.ස.)</u>**

සියලුදෙනාටම සුබ නව වසරක් වේවා.කොහු සහ කොහුබත් ආශ්‍රිත කර්මාන්තයේ කඩා වැටීම සම්බන්ධව අදහස් දැක්වීම විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා - (එ.ජා.ප.)</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

කොහු සහ කොහුබත් ආශ්‍රිත කර්මාන්තයේ කඩා වැටීම සම්බන්ධව අදහස් දැක්වීම විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව කොහු සහ කොහුබත් ආශ්‍රිත කර්මාන්තයේ කඩා වැටීම සම්බන්ධව අදහස් දැක්වීම විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

මීළඟට මගේ විශේෂ පණිවිඩයක් ඉදිරිපත් කරනවා.අපි පසුගිය වසරේ අපේ සභාවේ කටයුතු අපි පවත්වාගෙන ගියා.ඇත්තටම ඒක පඩුවස්නුවර ප්‍රාදේශිය සභාවේ දේශපාලන ඉතිහාසයේ පෙරළියක් වුණ සභාවක් විදියට මම මේ සභාව දකින්නේ.ඔබතුමන්ලාත් එය පිළිගනීවි. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ලෙස පත් වනවිට පක්ෂ විපක්ෂ බේදයකින් තොරව මාව සභාපතිවරයා ලෙස තෝරා පත් කර ගත්තා. ඉතින් ඔබතුමන්ලාගේ අරමුණු ඉෂ්ට කරන්න, ඒ වගේම සභාවක්,පළාත් පාලන ආයතනයක්, මහජන නියෝජන ආයතනයක් හැටියට ස්වාධීනව කටයුතු කිරීමේ අයිතිය ඔබතුමන්ලාට මම මෙම කාලවකවානුවිදී ලබා දුන්නා. මට යම් යම් ප්‍රශ්න ආව තැන් තිබුණා. මගේ අදහස් ප්‍රතික්ෂේප කළ මන්ත්‍රිවරුත් ඉන්නවා. නමුත් බහුතරය මගේ මතය ගරු කළා. එනිසා මේ අවස්ථාවේ මම කියනවා අපි පසුගිය වසරේ විවිධ ප්‍රශ්නවලට දේශපාලන අරගල වලට අපේ රට මුහුණ දුන්නා.එවැනි අවස්ථාවල ජනතාවගේ කළකිරීමක් තිබුණ තැන් අපි දැක්කා. ප්‍රචන්ඩකාරී අවස්ථා අපි දැක්කා.ඒ නිසා මම කල්පනා කළා පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව අපි ආයතනයක් විදියට අපේ පඩුවස්නුවර බල ප්‍රදේශය තුළ ජනගහණය එක්ලක්ෂ පන්දාහක් පමණ ඉන්නවා.අපේ ග්‍රාම නිලධාරී වසම් 103 තියෙනවා. ප්‍රාදේශීය සභා කොට්ඨාස 22ක් තියෙනවා.මන්ත්‍රිවරු 38 දෙනෙක් ඉන්නවා. මේ 38 දෙනා ට මේ බල ප්‍රදේශය තුළ බාධාවකින් තොරව කටයුතු කිරීමට මම අවස්ථාව ලබා දුන්නා. ඔබතුමන්ලා මහජන නියෝජිතයෝ විදියට අපේක්ෂා කළේ ගෞරවාන්විත දේශපාලනයක් කරන මහජන නියෝජිතයෝ විදියට මේ ආයතනයේ කටයුතු කරන්න.ඒ අවස්ථාව ඔබතුමන්ලාට දුන්නා.ඒ වගේම අපේ බල ප්‍රදේශයේ ජනතාව අපේක්ෂා කළා ගෞරවාන්විත දේශපාලනයක් කරන මහජන නියෝජිතයෝ කණ්ඩායමක් පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව තුළින් බිහිවීම.මම හිතනවා ජනතා අපේක්ෂාව හා මහජන නියෝජිත ගරු මන්ත්‍රීතුමන්ලා හා තුමියන්ලාගේ අපේක්ෂාවන් ඉටු කරපු යුගයක් විදියට මේ කාලය මම මේ අවස්ථාවේදී සිහිපත් කරනවා.ඒ වගේම ප්‍රාදේශිය සභාවේ කටයුතු කරද්දී මහජනතාව අපි කෙරෙහි ලොකු විශ්වාසයක් තියෙනවා. පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ හොඳ කළමනාකරණයක් තියෙනවා.විනිවිද භාවයකින් යුතුව කටයුතු කරනවා.අසාධාරණයට අයුක්තියට එරෙහිව සටන් කරනවා.ඒ වගේම සභාවට ලැබෙන සම්පත් සාධාරණ විදියට කළමනාකරණය කරලා මහජන විනිවිද භාවයකින් කටයුතු කරන ආයතනයක් විදියට මේ වකවානුව තුළ ප්‍රාදේශීය සභාව පත්වුණා.උදාහරණයක් විදියට අපේ සභාවට බදු ගෙවන ව්‍යාපාරික ආයතන ඒ වගේම අන්‍ය ආයතන අපි කෙරෙහි ලොකු විශ්වාසයක්, ගෞරවයක් තියෙනවා. පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව බොහෝම යහපත් විදියට මහජන අයිතීන් ආරක්ෂා කරමින්, වගකීමෙන් යුතුව, අවංක භාවයෙන් යුතුව, අල්ලසෙන්, දූෂණයෙන් තොරව විනිවිද භාවයෙන් යුතුව කටයුතු කරන ආයතනයක් විදියට.අපි දන්නවා පසුගිය කාලවකවානුව තුළ අපිත් අපේ රටේ ජනතාවත් දැඩි දුෂ්කරතාවන්ට මුහුණදෙමින් ජිවත් වුණා.නමුත් සභාවේ ආදායම් අංශය ගත්තාම ඔවුන්ගේ ප්‍රගති සමාලෝචනයක් ආදායම් ප්‍රවර්ධන නිලධාරී මහතාගෙන් මම ලබා ගත්තා.මෙවැනි දුෂ්කරතා තිබෙන තැන්වල අපේ ප්‍රාදේශීය සභාවේ අපේ නිලධාරීන් ආදායම් රැස් කරන්නේ තර්ජනය කරලා, උසාවි ගෙනියනවා කියලා, නඩු දානවා කියලා නෙවෙයි. ඒ අය ගියාම වරිපනම් බදු,කුලී ආදායම් ගෙවන ඒ ව්‍යාපාරික පුද්ගලයෝ අපි කෙරෙහි ලොකු විශ්වාසයක් තිබෙනවා. අපිට මේ දුෂ්කර කාල සීමාවේදී වුණත් සභාව කෙරෙහි ලොකු විශ්වාසයක් තබලා පැහැර හරින්නැතුව, මග හරින්නැතුව ඒ ආදායම් අපේ සභාවට ලබාදෙන්න කටයුතු කළා.ඒ අනුව,

| අනු අංකය | විෂය නිලධාරී | අය ශීර්ෂ නාමය | ඇස්තමේන්තුගත ආදායම /බිල් කල ආදායම | රැස් කල ආදායම | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| 01 | සුනේත්‍රා මිය | කඩ කුලී | 8907400.00 | 8911257.20 | 100% |
| 02 | දිල්රුක්ෂි මිය | වත්කම් බදු දීම | 11720237.00 | 11720237.00 | 100% |
| 03 | අජන්තා මිය | වරිපනම් බදු | 1706575.65 | 1414565.73 | 100% |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | අක්කර බදු | 30170.00 | 41708.00 | 100% |
| 04 | අරුණි මිය | විනෝද බදු | 400000.00 | 707580.00 | 100% |
| 05 | ශ්‍රියාකාන්ති මිය | ව්‍යාපාර බදු | 755400.00 | 1173600.00 | 100% |
| | | කර්මාන්ත බදු | 41500.00 | 41500.00 | 100% |
| 06 | රේණුකා මිය,<br>නදීකා මිය,<br>ජයනාලි මිය | ජල බිල්පත් | 4919128.00 | 4798471.04 | 97.5% |
| 07 | ෂිමාරා මිය | බලපත්‍ර | 368000.00 | 855750.00 | 100% |

මෙන්න ප්‍රගතිය. ඉතින් ඒ නිසා අපි ජනතාව විසින් පත් කරන නියෝජිතයෝ විදියට, ජනතාව විසින් වැටුප් ගෙවන නිලධාරීන් විදියට අපේ කාර්යභාරය හරියට කරලා තියෙනවා.මම මේ කාරණාව ඉදිරිපත් කලේ, ලේකම් මහතා ඇතුළු නිලධාරීන් සියලුදෙනාට බාධාවකින් තොරව වැඩ කරන්න නිදහස ලබාදුන් බව පැහැදිලි කරන්න. වෙනත් තැන්වල නිලධාරීන්ට, රියදුරන්ට, කම්කරුවන්ට බලපෑම් කරනවා නමුත් අපි එහෙම නෑ.අපි හොඳ වැඩපිළිවෙලක් හදලා දුන්නා. ලේකම් තුමා ,අංශභාර නිලධාරීන් ඒවා ක්‍රියාත්මක කළා.ඉතින් මෙවැනි ජයග්‍රහණයන් ලබපු ආයතනයක් තමයි අපේ ප්‍රාදේශීය සභාව.අපි වැඩ කරන නිලධාරී, වැඩ කරන ගරු මන්ත්‍රීවරු ඇගයීමට ලක් කරන්න අවශ්‍යයි. ඒ නිසා මේ ගරු සභාවේදී ඔවුන්ට හෘදයංගම ස්තූතිය පුද කරනවා.ඒ වගේම අපේ අනෙක් අංශ ගත්තාම විශේෂයෙන්ම පුස්තකාල ඉතාමත් හොඳ කළමනාකරණයකින් යුතුව පිරිසිදුව, පිළිවෙලට වැඩ කරනවා.පුස්තකාල 07ම ඉතාම හොඳ මට්ටමෙන් පවත්වාගෙන යනවා. ඒ වගේම අනෙකුත් ප්‍රජාමණ්ඩල, පෙර පාසල් ඉතාම හොඳට පවත්වාගෙන යනවා.පෙර පාසල් පාලිකාවන්ට පුහුණු වැඩ සටහන් ආදිය කලා. ඉතින් අපිට සහයෝගය දක්වන ආයතන අපි කෙරෙහි ලොකු විශ්වාසයක් තැබුවා.විශේෂයෙන්ම හෙට්ටිපොල ජාතික ඉතිරි කිරීමේ බැංකුව අපේ පෙර පාසල් 78ක පෙර පාසල් දරුවෝ 4600ක් එකතු කරලා කළ සතිපොල භූමියේදී ඒ අයගේ අනුග්‍රහයන් ලබා දුන්නා. ඒවා මම මේ අවස්ථාවේදී බොහෝම ගෞරවයෙන් සිහිපත් කරනවා. ඒ වගේම අපේ අනෙකුත් ස්ථාන කාර්යාල භූමි, හරිත උද්‍යාන, සියඹලාගස්වැටිය වැව පිරිසිදු කිරීම්, සුන්දර ස්ථාන බවට පත් කිරීම් ඒවා ඉතාමත් සාර්ථක වූ බව ජනතාව දැක්කා.ඒ නිසා අපේ පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව ඔබතුමන්ලා සමඟ එකතුවෙලා මම මෙය පවත්වාගෙන යන කාලසීමාව ජනතාවගේ ඇගයීමට ලක්වෙලා තියෙනවා. පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව පක්ෂ භේදයකින් තොරව ස්වාධීනව තම තමන්ගේ දේශපාලන පක්ෂවල අනන්‍යතාවය ආරක්ෂා කරමින් ජනතා මෙහෙවරක් කරන ආයතනයක් බවට ජනතාවගේ ගෞරවයට පත්වෙලා තිබෙනවා. විශේෂයෙන්ම අපේ ලේකම්තුමා, අපේ කාර්යමණ්ඩලයේ සියලුමදෙනා මම බොහෝම ගෞරවයෙන් සිහිපත් කරනවා අපිට දැක්වූ සහයෝගය වෙනුවෙන්. ඔබතුමන්ලාට නිදහසේ, ස්වාධීනව වැඩ කරන්න ඉදිරියේදීත් අවස්ථාව සහ ශක්තිය, ධෛර්යය, වාසනාව ලැබේවායි ප්‍රාර්ථනා කරනවා.

ගරු සභාපතිතුමා විසින් 2022.12.13 දින මහා සභාවේ ප්‍රගතිය ඉදිරිපත් කරන ලදී.

## 03. ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සංනිවේදන.

## I.නිවාඩු අනුමත කිරීම.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.එම්.ප්‍රදී සමන් කුමාරසිරි තෙන්නකෝන් මහතා ,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනි ඒ.පී.සචින්තා අමාලි මෙනවිය වෙත නිවාඩු අනුමත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා - (පො.ජ.පෙ.)</u>

ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.එම්.ප්‍රදීප් සමන් කුමාරසිරි තෙන්නකෝන් මහතා ,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද

දසනායක මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.සචින්තා අමාලි මෙනවිය වෙත අද දින සභාවේ නිවාඩු අනුමත කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

<u>**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා - (එ.ජා.ප.)**</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**</u>

ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.එම්.ප්‍රදීප් සමන් කුමාරසිරි තෙන්නකෝන් මහතා ,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනි ඒ.පී.සචින්තා අමාලි මෙනවිය වෙත අද දින සභාවේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.එම්.ප්‍රදීප් සමන් කුමාරසිරි තෙන්නකෝන් මහතා ,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනි ඒ.පී.සචින්තා අමාලි මෙනවිය වෙත අද දින සභාවේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාව ඒකමතිකව සහා සම්මත කරන ලදී.**

## II. 2022.12.08 දින මුදල් කමිටුව සඳහා සහභාගී නොවූ මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීම.

<u>**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**</u>

2022.12.08 දින මුදල් කමිටුවට සහභාගී නොවූ ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී නිමාලි දිල්හානි මෙනවිය,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.ආර්.එම්.අපර්ණ නිලුපුල් මහතා ,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී අයි.සද්නා දිල්හානී ප්‍රනාන්දු මහත්මිය, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා වෙත නිවාඩු අනුමත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා - (පො.ජ.පෙ.)**</u>

2022.12.08 දින මුදල් කමිටුවට සහභාගී නොවූ ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී නිමාලි දිල්හානි මෙනවිය,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.ආර්.එම්.අපර්ණ නිලුපුල් මහතා ,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී අයි.සද්නා දිල්හානී ප්‍රනාන්දු මහත්මිය, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා වෙත නිවාඩු අනුමත කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

<u>**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා - (එ.ජා.ප.)**</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**</u>

2022.12.08 දින මුදල් කමිටුවට සහභාගී නොවූ ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී නිමාලි දිල්හානි මෙනවිය,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.ආර්.එම්.අපර්ණ නිලුපුල් මහතා ,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී අයි.සද්නා දිල්හානී ප්‍රනාන්දු මහත්මිය, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා වෙත නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022.12.08 දින මුදල් කමිටුවට සහභාගී නොවූ ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක**

**මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී නිමාලි දිල්හානි මෙනවිය,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.ආර්.එම්.අපර්ණ නිලුපුල් මහතා ,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි.සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා වෙත නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

## III. 2022.12.21 දින ප්‍රසම්පාදන කමිටුව සඳහා සහභාගී නොවූ මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීම.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

2022.12.21 දින ප්‍රසම්පාදන කමිටුවට සහභාගී නොවූ ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.අමරසිංහ මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි.ඒ.බණ්ඩාර මැණිකා මහත්මිය, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.අයි.එම්.ජාබීර් මහතා ,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී එච්.එම්.උදේශිකා මාධවී හේරත් මහත්මිය වෙත නිවාඩු අනුමත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා - (පො.ජ.පෙ.)**

2022.12.21 දින ප්‍රසම්පාදන කමිටුවට සහභාගී නොවූ ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.අමරසිංහ මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි.ඒ.බණ්ඩාර මැණිකා මහත්මිය, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.අයි.එම්.ජාබීර් මහතා ,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී එච්.එම්.උදේශිකා මාධවී හේරත් මහත්මිය වෙත නිවාඩු අනුමත කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා - (එ.ජා.ප.)**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

2022.12.21 දින ප්‍රසම්පාදන කමිටුවට සහභාගී නොවූ ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.අමරසිංහ මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි.ඒ.බණ්ඩාර මැණිකා මහත්මිය, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.අයි.එම්.ජාබීර් මහතා ,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී එච්.එම්.උදේශිකා මාධවී හේරත් මහත්මිය වෙත නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022.12.21 දින ප්‍රසම්පාදන කමිටුවට සහභාගී නොවූ ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.අමරසිංහ මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි.ඒ.බණ්ඩාර මැණිකා මහත්මිය, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.අයි.එම්.ජාබීර් මහතා ,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී එච්.එම්.උදේශිකා මාධවී හේරත් මහත්මිය වෙත නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

## IV. 2022.12.22 දින මුදල් කමිටුව සඳහා සහභාගී නොවූ මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීම.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

2022.12.22 දින මුදල් කමිටුවට සහභාගී නොවූ ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී නිමාලි දිල්හානි මෙනවිය, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.ආර්.එම්.අපර්ණ නිලුපුල් මහතා , ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි.සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඩී.මනෝ කුමාර එදිරිසිංහ මහතා වෙත නිවාඩු අනුමත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා - (පො.ජ.පෙ.)**

2022.12.22 දින මුදල් කමිටුවට සහභාගී නොවූ ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී නිමාලි දිල්හානි මෙනවිය, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.ආර්.එම්.අපර්ණ නිලුපුල් මහතා , ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි.සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී

ඩබ්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඩී.මනෝ කුමාර එදිරිසිංහ මහතා වෙත නිවාඩු අනුමත කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා - (එ.ජා.ප.)</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

2022.12.22 දින මුදල් කමිටුවට සහභාගී නොවූ ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී නිමාලි දිල්හානි මෙනවිය, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.ආර්.එම්.අපර්ණ නිලුපුල් මහතා , ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී අයි.සද්නා දිල්හානී ප්‍රනාන්දු මහත්මිය, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඩී.මනෝ කුමාර එදිරිසිංහ මහතා වෙත නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022.12.22 දින මුදල් කමිටුවට සහභාගී නොවූ ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී නිමාලි දිල්හානි මෙනවිය, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.ආර්.එම්.අපර්ණ නිලුපුල් මහතා , ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී අයි.සද්නා දිල්හානී ප්‍රනාන්දු මහත්මිය, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඩී.මනෝ කුමාර එදිරිසිංහ මහතා වෙත නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාව ඒකමතිකව සහා සම්මත කරන ලදී.**

## V. පුණ්‍යානුමෝදනා පූර්වක ස්තූතිය පුද කිරීම.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

2022.11.26 දාතමින් මූණමල්දෙනිය, ශ්‍රී පුෂ්පාරාම රාජමහා විහාරස්ථානයේ ශ්‍රී පුණ්‍යවර්ධන කාර්ය සාධක සමිතිය විසින් ලිපියක් එවා තිබෙනවා.ඒ අනුව පහළ ගොමුගොමුව ශ්‍රී පුෂ්පාරාම රාජමහා විහාරාධිපති- බුජ්ගමුව වේළුවන භාවනා මධ්‍යස්ථානාධිපති කම්මට්ඨානාචාර්ය පූජ්‍යපාද පිදුමේ සද්ධාතිස්ස ලොකු ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අපවත්වීම දැනගත් මොහොතේ පටන්ම ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති සහ ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.වාමින්ද දසනායක මහතා එක්ව ප්‍රාදේශීය සභාවේ කාර්යය මණ්ඩලය එක්ව ලබාදුන් අනුග්‍රාහකත්වය වචනයෙන් සඳහන් කලනොහැකි අමිල මෙහෙවරක් බවත්, දේශපාලන විෂයට විහාරාධිකාරී ස්වාමීන්වහන්සේ සම්බන්ධ නැති නිසා පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා කවුරුන්දැයි නොදැන සිටි බවත් දන්වා තිබෙනවා. එමෙන්ම ලොකු හාමුදුරුවන් වහන්සේගේ ආදාහන පූජෝත්සවය වෙනුවෙන් ප්‍රාදේශීය සභාවෙන් සිදුකළ හැකි සෑම කාර්යයක්ම නොපැකිලව නොපමාව ඉටුකර දීමත් සෑම දිනකම විහාරස්ථානය වෙත පැමිණ අවශ්‍ය කටයුතු සොයා බලා ඉටුකර දුන්නාස්ම සෑම දිනයකම රාත්‍රී 08.00ට පැවති කමිටු රැස්වීමට සහභාගී වෙමින් තම ආයතනයෙන් සිදු කළහැකි දෑ ඇත්දැයි සොයා බලා කටයුතු කිරීම පැසසුමට ලක් කර තිබෙනවා. වැසිකිළි කැසිකිළි පහසුකම් පිළිබඳව ඔවුන් උග්‍ර ගැටළුවකට පත්වූ මොහොතේ එය විසඳා දීමට යුහුසුළුව ක්‍රියා කිරීම ඉතා ප්‍රශංසනීය බවත් ආදාහන පූජෝත්සව කටයුතු ඉතා සාර්ථකව සිදු කර ගැනීමට විවිධ අඩුපාඩුකම් සපයාදෙමින් මා ඇතුළු ප්‍රධාන කාර්යය මණ්ඩලය සිදුකර දුන් අමිල මෙහෙවර මෙසේ අගය කොට තිබෙනවා. මා ප්‍රධාන සෑම සියලුදෙනාටම සියලු යහපත ශාන්තිය සැනසීම දියුණුව ආලෝකය සැලසේවා සිදු කරනු ලබන තවතවත් සමාජ මෙහෙවර පුළුල්ව සිදු කරන්නට ශක්තිය බලය ධෛර්යය නිදුක් නිරෝගී සුවය ලැබේවා පරලොව යහපත උදාවේවා නිවන්සුව දකින්න හේතු වාසනාවේවායි ප්‍රාර්ථනා කරමින් පුණ්‍යානුමෝදනා පූර්වක ස්තූතිය විහාරාධිකාරී වත්තේගෙදර විමලතිස්ස හිමි හා විහාරස්ථ දායක සභාව පුද කර තිබෙනවා.

**ඒ අනුව මූණමල්දෙනිය, ශ්‍රී පුෂ්පාරාම රාජමහා විහාරස්ථානයේ ශ්‍රී පුණ්‍යවර්ධන කාර්ය සාධක සමිතිය විසින් ඉදිරිපත් කර ඇති පුණ්‍යානුමෝදනා පූර්වක ස්තූතිය පුද කිරීම ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.**

## VI. ශ්‍රී ලංකා දෘශ්‍යාබාධිත ජනතා සම්මේලනයේ කෘතවේදීත්වය හා පුණ්‍යානුමෝදනාව පල කිරීම.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

පුගල්ල, කිතලව ශ්‍රී ලංකා දෘශ්‍යාබාධිත ජනතා සම්මේලනය විසින් 2022.12.08 දාතමින් යොමු කොට ඇති ලිපියට අනුව එම සම්මේලන ශාඛාව මඟින් සංවිධානය කෙරුණු 2022 ආබාධිත තැනැත්තන් සඳහා වූ ජාත්‍යන්තර දින සමරු වැඩසටහන 2022.12.04 වන දින පෙරවරුවේ හෙට්ටිපොල ප්‍රජා ශාලාවේදී සාර්ථකව පවත්වන්නට හැකි වූ බව දන්වා තිබෙනවා.ඒ සඳහා මූල්‍ය අනුග්‍රහය ලබා දීම තුලින් මෙන්ම ශාලා හා ශබ්ද විකාශන යන්ත්‍ර පහසුකම් නොමිලයේ ලබාදීමෙන් ද දෘශ්‍යාබාධිත අය වෙනුවෙන් සුදු සැරයටි, අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුලත් බෑගයන්, දෘශ්‍යාබාධිත දෙමාපියන්ගේ දරුවන්හට අභ්‍යාස පොත් ඇතුලු පාසල් උපකරණ පරිත්‍යාග කිරීමෙන්ද, එදින දිවා ආහාරය සහ උදේ ආහාරය ඇතුලු සංග්‍රහ පහසුකම් සැපයීමෙන්ද ආරාධිත අමුත්තන් වශයෙන් ඊට සහභාගීවීම තුළින්ද අප සැම දායකත්වය අගය කර තිබෙන අතර ඒ සම්බන්ධයෙන් ඔවුන්ගේ ගෞරවනීය කෘතවේදීත්වය හා පුණ්‍යානුමෝදනාව පල කර තිබෙනවා.

**ඒ අනුව පුගල්ල, කිතලව ශ්‍රී ලංකා දෘශ්‍යාබාධිත ජනතා සම්මේලනය විසින් ඉදිරිපත් කර ඇති කෘතවේදීත්වය හා පුණ්‍යානුමෝදනාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.**

## VII. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 18(2) වගන්තිය යටතේ විගණන ගාස්තු තීරණය කිරීම.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 18(2) වගන්තිය යටතේ විගණන ගාස්තු තීරණය කිරීම සම්බන්ධයෙන් වයඹ ප්‍රධාන අමාත්‍යංශ ලේකම්ගේ අංක NWP/CM/AC08/42 හා 2022.12.29 දිනැති ලිපිය හා බැඳුනු, 2021 වර්ෂයට අදාලව පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව විසින් ගෙවිය යුතු විගණන ගාස්තු පිළිබඳ දන්වා ඇති අතර ඒ සඳහා එකඟතාවන් හා නිර්දේශ විමසා ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. ගෙවිය යුතු විගණන ගාස්තු ලෙස රු.169,200.00ක මුදලක් සඳහන් කර තිබෙනවා. එම කාරණය සඳහා සභා සම්මුතියක් ලබා ගැනීමට යෝජනා ස්ථිර කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි.සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)**</u>

2021 වර්ෂයට අදාලව පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව විසින් ගෙවිය යුතු විගණන ගාස්තු ලෙස රු. 169,200.00ක මුදල ගෙවීම සුදුසු බව මා යෝජනා කරනවා.

<u>**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඩී. නිමාලි දිල්හානි මෙනවිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)**</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

2021 වර්ෂයට අදාලව පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව විසින් ගෙවිය යුතු විගණන ගාස්තු ලෙස රු. 169,200.00ක මුදල ගෙවීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2021 වර්ෂයට අදාලව පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව විසින් ගෙවිය යුතු විගණන ගාස්තු ලෙස රු. 169,200.00ක මුදල ගෙවීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## VIII. අත්තිකාරම් ගෙවීම සම්බන්ධව.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

2022.12.01 දාතමින් විදුලි බල මණ්ඩලයේ කළමණාකාර අධ්‍යක්ෂතුමා විසින් එවා ඇති ලිපියට අනුව පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් හෙට්ටිපොල සතිපොල සඳහා සූර්ය බල ශක්තිය මඟින් විදුලිය නිපදවීමේ ව්‍යාපෘතියට අදාලව සැලසුම්, සැපයුම්, පරීක්ෂණ ආරම්භ කිරීම සහ 20kw සූර්ය පද්ධතිය නඩත්තු කිරීම වෙනුවෙන් අත්තිකාරම් ලෙස රු. 1,464,100.00ක මුදලක් ඉල්ලා තිබෙනවා.එය ගෙවීම සඳහා සහා සම්මුතියක් ලබා ගැනීමට යෝජනා ස්ථිර කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා - (එ.ජා.ප.)**

2022.12.01 දාතමින් විදුලි බල මණ්ඩලයේ කළමණාකාර අධ්‍යක්ෂතුමා විසින් එවා ඇති ලිපියට අනුව පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් හෙට්ටිපොල සතිපොල සඳහා සූර්ය බල ශක්තිය මඟින් විදුලිය නිපදවීමේ ව්‍යාපෘතියට අදාලව සැලසුම්, සැපයුම්, පරීක්ෂණ ආරම්භ කිරීම සහ 20kw සූර්ය පද්ධතිය නඩත්තු කිරීම වෙනුවෙන් අත්තිකාරම් ලෙස රු. 1,464,100.00ක මුදල ගෙවීම සුදුසු බව මා යෝජනා කරනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා - (එ.ජ.නි.ස.)**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

2022.12.01 දාතමින් විදුලි බල මණ්ඩලයේ කළමණාකාර අධ්‍යක්ෂතුමා විසින් එවා ඇති ලිපියට අනුව පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් හෙට්ටිපොල සතිපොල සඳහා සූර්ය බල ශක්තිය මඟින් විදුලිය නිපදවීමේ ව්‍යාපෘතියට අදාලව සැලසුම්, සැපයුම්, පරීක්ෂණ ආරම්භ කිරීම සහ 20kw සූර්ය පද්ධතිය නඩත්තු කිරීම වෙනුවෙන් අත්තිකාරම් ලෙස රු. 1,464,100.00ක මුදල ගෙවීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022.12.01 දාතමින් විදුලි බල මණ්ඩලයේ කළමණාකාර අධ්‍යක්ෂතුමා විසින් එවා ඇති ලිපියට අනුව පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් හෙට්ටිපොල සතිපොල සඳහා සූර්ය බල ශක්තිය මඟින් විදුලිය නිපදවීමේ ව්‍යාපෘතියට අදාලව සැලසුම් ,සැපයුම්, පරීක්ෂණ ආරම්භ කිරීම සහ 20kw සූර්ය පද්ධතිය නඩත්තු කිරීම වෙනුවෙන් අත්තිකාරම් ලෙස රු. 1,464,100.00ක මුදල ගෙවීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත විය.**

## IX. ස්ථාවර තැන්පත් ගිණුම් සම්බන්ධව.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

2023.01.03 දිනට කල් පිරීමට නියමිත රු.මිලියන 30ක් වටිනා ස්ථාවර තැන්පත් ගිණුමක් හා 2022.12.30 දිනට කල් පිරී ඇති රු.1586238.00ක් වටිනා ස්ථාවර තැන්පතුවක් හා ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කළ හැකි 2023 වර්ෂය වෙනුවෙන් වත්කම් බදු දීමෙන් ලද ටෙන්ඩර් තැන්පත් රු.1518515.00ක මුදලක් ද පවතින බැවින් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ වැඩිම පොලී ප්‍රතිශතය වන 26.1% යටතේ නැවත ආයෝජනය සඳහා සුදුසු බවටත්, යම් හෙයකින් එකී පොලී අනුපාතය මුදල් තැන්පත් කරන දිනය වනවිට වෙනස් වන්නේ නම් අදාළ බැංකුවේම පවතින පොලී අනුපාතය මත මුදල් තැන්පත් කිරීම සුදුසු බවටත් සහා සම්මුතියක් ලබා ගැනීමට යෝජනා ස්ථිර කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා - (එ.ජා.ප.)**

2023.01.03 දිනට කල් පිරීමට නියමිත රු.මිලියන 30ක් වටිනා ස්ථාවර තැන්පත් ගිණුමක් හා 2022.12.30 දිනට කල් පිරී ඇති රු.1586238.00ක් වටිනා ස්ථාවර තැන්පතුවක් හා ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කළ හැකි 2023 වර්ෂය වෙනුවෙන් වත්කම් බදු දීමෙන් ලද ටෙන්ඩර් තැන්පත් රු.1518515.00ක මුදලක් ද පවතින බැවින් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ වැඩිම පොලී ප්‍රතිශතය වන 26.1% යටතේ නැවත ආයෝජනය සඳහා සුදුසු බවටත්, යම් හෙයකින් එකී පොලී අනුපාතය මුදල් තැන්පත් කරන දිනය වනවිට වෙනස් වන්නේ නම් අදාළ බැංකුවේම පවතින පොලී අනුපාතය මත මුදල් තැන්පත් කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය- (එ.ජා.ප.)</u>**
එම යෝජනාව මා ස්ථිර කරනවා.
**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**
2023.01.03 දිනට කල් පිරීමට නියමිත රු.මිලියන 30ක් වටිනා ස්ථාවර තැන්පත් ගිණුමක් හා 2022.12.30 දිනට කල් පිරී ඇති රු.1586238.00ක් වටිනා ස්ථාවර තැන්පතුවක් හා ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කළ හැකි 2023 වර්ෂය වෙනුවෙන් වත්කම් බදු දීමෙන් ලද ටෙන්ඩර් තැන්පත් රු.1518515.00ක මුදලක් ද පවතින බැවින් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ වැඩිම පොලී ප්‍රතිශතය වන 26.1% යටතේ නැවත ආයෝජනය සඳහා සුදුසු බවටත්, යම් හෙයකින් එකී පොලී අනුපාතය මුදල් තැන්පත් කරන දිනය වනවිට වෙනස් වන්නේ නම් අදාළ බැංකුවේම පවතින පොලී අනුපාතය මත මුදල් තැන්පත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2023.01.03 දිනට කල් පිරීමට නියමිත රු.මිලියන 30ක් වටිනා ස්ථාවර තැන්පත් ගිණුමක් හා 2022.12.30 දිනට කල් පිරී ඇති රු.1586238.00ක් වටිනා ස්ථාවර තැන්පතුවක් හා ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කළ හැකි 2023 වර්ෂය වෙනුවෙන් වත්කම් බදු දීමෙන් ලද ටෙන්ඩර් තැන්පත් රු.1518515.00ක මුදලක් ද පවතින බැවින් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ වැඩිම පොලී ප්‍රතිශතය වන 26.1% යටතේ නැවත ආයෝජනය සඳහා සුදුසු බවටත්, යම් හෙයකින් එකී පොලී අනුපාතය මුදල් තැන්පත් කරන දිනය වනවිට වෙනස් වන්නේ නම් අදාළ බැංකුවේම පවතින පොලී අනුපාතය මත මුදල් තැන්පත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## 04.යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත
## 05.යථා පරිදි කල් දී ඇති යෝජනා-

### I.මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා කාරක සභාවක් පත් කිරීම හා එය පැවැත්වෙන දිනයන් හා වේලාව තීරණය කිරීම-2023

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>
2023 වර්ෂය සඳහා මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම , නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභා පනතේ 12 (2) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් හා තුමියන්ලාගෙන් සැදුම්ලත් කාරක සභාවක් පත් කිරීමටත්, මෙම කමිටුව සෑම මසකටම දෙවතාවක් රැස්වීමටත් සුදුසු බව මා යෝජනා කරනවා.

01.ගරු සභාපති බී.ඇම්.ධර්මසේන බමුණුසිංහ මහතා
02.ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා
03.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා
04.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා
05.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී අයි.සඳනා දිල්හානී ප්‍රනාන්දු මහත්මිය
06.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය
07.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඩී.මනෝකුමාර එදිරිසිංහ මහතා
08.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය
09.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය මහතා
10.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එම්.පයිසර් මහතා
11. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.ඩී.රංජිත් ප්‍රේමලාල් මහතා
12.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල්.ඒ.විරාජ් මධුසංඛ විජේසිංහ මහතා

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය - (එ.ජා.ප.)</u>**

2023 වර්ෂය සඳහා මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම , නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභා පනතේ 12 (2) වගන්තිය ප්‍රකාරව ඉහත සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් හා තුමියන්ලාගෙන් සැදුම්ලත් කාරක සභාවක් පත් කිරීමටත්, මෙම කමිටුව සෑම මසකටම දෙවතාවක් රැස්වීමටත් සුදුසු බව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2023 වර්ෂය සඳහා මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම , නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභා පනතේ 12 (2) වගන්තිය ප්‍රකාරව ඉහත සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් හා තුමියන්ලාගෙන් සැදුම්ලත් කාරක සභාවක් පත් කිරීමටත්, මෙම කමිටුව සෑම මසකටම දෙවතාවක් රැස්වීමටත් සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2023 වර්ෂය සඳහා මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම , නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභා පනතේ 12 (2) වගන්තිය ප්‍රකාරව ඉහත සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් හා තුමියන්ලාගෙන් සැදුම්ලත් කාරක සභාවක් පත් කිරීමටත්, මෙම කමිටුව සෑම මසකටම දෙවතාවක් රැස්වීමටත් සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත විය.**

## II. මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය, කාර්මික සේවා, පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා කාරක සභාවට බලතල පැවරීම-2023

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2023 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභා පනතේ 12 (2) වගන්තිය ප්‍රකාරව මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම , නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාව සඳහා මූල්‍ය සීමාව රුපියල් ලක්ෂ 20 දක්වා වූ සියලු ඇස්තමේන්තු අනුමත කිරීම,ගෙවීම,ගිවිසුම්ගත වීමට අදාල තීරණ ගැනීම,වාර්ෂික වත්කම් බදු දීම සහ පුවත්පත් දැන්වීම් මඟින් කරනු ලබන ටෙන්ඩර් කැඳවීම් වලට අදාල නොවන්නා වූ සියලු මිල ගණන් කැඳවීමේ බලය සහ ඒ සඳහා ගෙවීම් කිරීමටද බලය පැවරීමත්,මෙම කමිටුව සෑම මසකටම දෙවතාවක් රැස්වීමත්,ගරු සභාපතිතුමා වෙත මෙම කමිටු ආවරණ අනුමැතියට යටත්ව රු.200,000.00 දක්වා වූ ගෙවීම් කිරීමට හා මිල ගණන් කැඳවීමට බලය පැවරීමත්,මාර්ග මෝටර් ග්‍රේඩර් කිරීම,කාණු කැට ලබා දීම හා ශ්‍රමදාන වැඩසටහන් සඳහා ගරු සභාපතිතුමාට බලය පැවරීමත් තවද මෙම කාරක සභාව සඳහා රු.2,000,000.00 දක්වා සිදු කරන්නා වූ සියලු වැඩ විෂයන් සම්බන්ධ ප්‍රතිපත්ති තීරණ ගැනීමේ බලය ද,ගෙවීම් කටයුතු කිරීමේ බලය ද ලබා දීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය - (එ.ජා.ප.)</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

ඒ අනුව 2023 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභා පනතේ 12 (2) වගන්තිය ප්‍රකාරව මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම , නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාව සඳහා මූල්‍ය සීමාව රුපියල් ලක්ෂ 20 දක්වා වූ සියලු ඇස්තමේන්තු අනුමත කිරීම,ගෙවීම,ගිවිසුම්ගත වීමට අදාල තීරණ ගැනීම,වාර්ෂික වත්කම් බදු දීම සහ පුවත්පත් දැන්වීම් මඟින් කරනු ලබන ටෙන්ඩර් කැඳවීම් වලට අදාල නොවන්නා වූ සියලු මිල ගණන් කැඳවීමේ බලය සහ ඒ සඳහා ගෙවීම් කිරීමටද බලය පැවරීමත්,මෙම කමිටුව සෑම මසකටම දෙවතාවක් රැස්වීමත්,ගරු සභාපතිතුමා වෙත මෙම කමිටු ආවරණ අනුමැතියට යටත්ව රු.200,000.00 දක්වා වූ ගෙවීම් කිරීමට හා මිල ගණන් කැඳවීමට බලය පැවරීමත්,මාර්ග මෝටර් ග්‍රේඩර් කිරීම,කාණු කැට ලබා දීම හා ශ්‍රමදාන වැඩසටහන් සඳහා ගරු සභාපතිතුමාට බලය පැවරීමත් තවද මෙම කාරක සභාව සඳහා රු.2,000,000.00 දක්වා සිදු කරන්නා වූ සියලු වැඩ

විෂයන් සම්බන්ධ ප්‍රතිපත්ති තීරණ ගැනීමේ බලය ද,ගෙවීම් කටයුතු කිරීමේ බලය ද ලබා දීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2023 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභා පනතේ 12 (2) වගන්තිය ප්‍රකාරව මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම , නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාව සඳහා මූල්‍ය සීමාව රුපියල් ලක්ෂ 20 දක්වා වූ සියලු ඇස්තමේන්තු අනුමත කිරීම,ගෙවීම,ගිවිසුම්ගත වීමට අදාල තීරණ ගැනීම,වාර්ෂික වත්කම් බදු දීම සහ පුවත්පත් දැන්වීම් මඟින් කරනු ලබන ටෙන්ඩර් කැඳවීම් වලට අදාල නොවන්නා වූ සියලු මිල ගණන් කැඳවීමේ බලය සහ ඒ සඳහා ගෙවීම් කිරීමටද බලය පැවරීමත්,මෙම කමිටුව සෑම මසකටම දෙවතාවක් රැස්වීමත්,ගරු සභාපතිතුමා වෙත මෙම කමිටු ආවරණ අනුමැතියට යටත්ව රු.200,000.00 දක්වා වූ ගෙවීම් කිරීමට හා මිල ගණන් කැඳවීමට බලය පැවරීමත්,මාර්ග මෝටර් ග්‍රේඩර් කිරීම,කාණු කැට ලබා දීම හා ශ්‍රමදාන වැඩසටහන් සඳහා ගරු සභාපතිතුමාට බලය පැවරීමත් තවද මෙම කාරක සභාව සඳහා රු.2,000,000.00 දක්වා සිදු කරන්නා වූ සියලු වැඩ විෂයන් සම්බන්ධ ප්‍රතිපත්ති තීරණ ගැනීමේ බලය ද,ගෙවීම් කටයුතු කිරීමේ බලය ද ලබා දීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

## III. කොහු සහ කොහුබත් ආශ්‍රිත කර්මාන්තයේ කඩා වැටීම සම්බන්ධව.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>
කොහු සහ කොහුබත් ආශ්‍රිත කර්මාන්තයේ කඩා වැටීම සම්බන්ධ විශේෂ යෝජනාව ඉදිරිපත් කිරීමට ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල්.ඒ.විරාජ් මධුසංක විජේසිංහ මහතාට අවස්ථාව ලබාදෙනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල්.ඒ.විරාජ් මධුසංක විජේසිංහ මහතා -(එ.ජ.නි.ස.)</u>**
සියලුදෙනාගෙන්ම අවසරයි, අද ලංකාවේ බොහෝ කර්මාන්තයන් කඩා වැටීමට ලක්වෙලා තිබෙනවා.නමුත් විශේෂයෙන්ම මම කතා කරන්න බලාපොරොත්තු වුණේ කොහු කර්මාන්තය සහ කොහුබත් ආශ්‍රිත නිෂ්පාදන සඳහා තිබුණු විදේශ වෙළඳපොලත් මුළුමනින්ම වාගේ ඇහිරිලා, නතරවෙලා තියෙන්නේ.මට මතක විදියට පසුගිය කොවිඩ් සමයේදීත් විදේශ අපනයන කර්මාන්තයක් විදියට කොහු සහ කොහුබත් කර්මාන්තය කඩාවැටීමක් සිදුවුණේ නෑ. ලංකාවට ඩොලර් උත්පාදනය වන මාර්ගයක් තමයි මේ කොහු සහ කොහුබත් අපනයනය.ලංකාවේ මොන කර්මාන්තය කඩා වැටුණත් මේ කොහු සහ කොහුබත් කර්මාන්තය හරහා විදේශ විනිමය, මුදල් විශාල පරිමාණයෙන් ගලාගෙන ආවා.ඒ හරහා කොහු මෝල් හිමියන් යැපුණා,ජීවත්වුණා වගේම ගමේ ඉන්න අසරණ මිනිස්සු ළඟ තිබෙන කොහු මෝලකට ගිහින් තම ජීවිකාව සරු කර ගත්තා.විශේෂයෙන්ම ගමේ ඉන්න කාන්තාවන් කොහුබත් මිලදී අරගෙන වියළි කොහුබත් බවට පත් කරලා ඒවා අලෙවි කරලා පවුලේ ආර්ථිකයට ශක්තියක් වුණා. ඒ වගේම හැටන්, නුවරඑළිය පැත්තේ මිනිස්සු ඇවිත් මේ පැතිවල කොහු මෝල්වලට සම්බන්ධ වෙලා මෙහි රස්සාව කරලා ගෙදරට සතියකට හෝ මාසයකට වතාවක් මුදල් යවලා පවුල් පෝෂණය කළා. දැන් ඒ සියල්ල නැවතිලා තියෙනවා. ඒකට ෙහ්තුව මම හිතන්නේ විශේෂයෙන්ම ඉන්ධන මිල ඉහළ යාම වෙන්න පුළුවන්.ඒත් එක්ක මේ නිෂ්පාදන මිල ඉහළ ගියේ නෑ. කළින් ඩීසල් ලීටරයක මිල රු.115.00ක් වගේ පැවතුණේ. නමුත් දැන් ඩීසල් ලීටරයක මිල රු.400.00යේ සීමාව අභිබවා ගිහිල්ලා තියෙන්නේ.අනෙක් කාරණය විදුලි බිල.සාමාන්‍යයෙන් කොහුමෝලක මාසික විදුලි බිල රු.40,000.00ක හෝ රු.50,000.00ක බිලක් වෙනවා. දැන් සංශෝධිත විදුලි බිලත් එක්ක රු.70,000.00ක රු.80,000.00ක බිලක් ඒ කර්මාන්තකරුවන්ට ලැබෙන්න පටන් ගත්තා.ඒ වගේම යකඩවල වියදම එහෙම නැත්නම් ඒ කොහුමෝල්වල භාවිතා කරනවා UCB/ MCB/රේසර් වගේ දේවල් හතර ගුණයකින් වගේ ඉහළ ගියා. මේ හේතුව නිසා කුඩා කොහුමෝල්කරුවෝ හා කටර්කරුවෝ සියලුදෙනාම මේ වනවිට වැඩ නවත්තලා කොටින්ම ඔවුන්ට යනඑනමං නැතිවෙලා තියෙනවා. ඒ වගේම ඒ නිෂ්පාදන ගෙනයන මහා පරිමාණ කර්මාන්තකරුවෝ ඉන්නවා.විශේෂයෙන්ම මේ **ට්‍රොපිකෝ** ආයතනය වගේ ලංකාවේ හඳුනාගත් කර්මාන්තකරුවෝ ඉන්නවා.ඔවුන් සමඟ සාකච්ඡා කරනකොට හඳුනාගත් දෙයක් තමා මේ නිෂ්පාදන ගමේ ඉඳලා ගෙනියද්දී විශාල ප්‍රවාහන වියදමක් දරන්න වෙලා තියෙන බව. ඩීසල් වියදම වැඩිවීම මත ඒ ප්‍රවාහන වියදම් වැඩිවෙලා තියෙනවා. ඒ වගේම කොහු අරන් ගිහින් කිලෝ 25 වගේ ප්‍රමාණයේ

කොහු කැට හදනවා. කිලෝ 50 වගේ ප්‍රමාණයේ කොහු කැට හදනවා.මේවා මැෂින් උපයෝගී කරගෙන තමයි කරන්නේ.ඒ සඳහා විශාල විදුලි බිලක් ගෙවන්න සිද්ධවෙලා තියෙනවා.ඒ වගේම උපකරණ මිලදී ගන්න විශාල වියදමක් යනවා.නමුත් දැන් ලංකාවේ ආයෝජනය කරනවාට වඩා මේ කර්මාන්තකරුවන්ට ඉන්දියාව,අනෙකුත් මේ පොල් ආශ්‍රිත නිෂ්පාදන තිබෙන රටවල්වල ආයෝජනය කිරීමට හැකිනම් ඔවුන්ට උපරිම ලාභ ලබන්න පුළුවන්. ලංකාවේ ට්‍රොපිකෝ ආයතනය වගේ ආයතන මේ නිෂ්පාදනවල හිනිපෙත්තටම ගිහින් තිබුණ ආයතන.නමුත් අද වනවිට ට්‍රොපිකෝ ආයතනය ඔවුන්ගේ කර්මාන්ත ගලවගෙන ගිහිල්ලා ඉන්දියාවේ වෙළඳපොලට සම්බන්ධවෙන්න තරම් මේ වෙද්දී ඔවුන් පෙළඹිලා තිබෙනවා.මම මෙය විශේෂ යෝජනාවක් විදියට ගේන්නේ වැවිලි කර්මාන්ත හා අපනයන කෘෂිකර්ම අමාත්‍යාංශයේ ඇමතිතුමාගේ අවධානයට යොමු කිරීමටයි. පසුගිය සතියේ මම දැක්කා රා කර්මාන්තය නඟා සිටුවලා ඒ හරහා ඩොලර් ගේන්න මඟක් විවර කරලා දුන්නා. කොහු නිෂ්පාදන ආශ්‍රිත මහා පරිමාණ කර්මාන්තකරුවන් සියලුදෙනා හඳුනාගෙන ඔවුන් හා එක්ව වැවිලි කර්මාන්ත හා අපනයන කෘෂිකර්ම අමාත්‍යාංශයේ ඇමතිතුමා සම්බන්ධ කරලා මේ තිබෙන ප්‍රශ්න ගැටළු හඳුනාගෙන වෙළඳපොල පහසුකම් ලබාදුන්නොත් ඉහළ සිට පහළටම නැවතිලා තිබෙන මේ යාන්ත්‍රණය නැවත ක්‍රියාත්මක වෙනවා. ඒ සඳහා විශේෂ යෝජනාවක් විදියට පොල් ත්‍රිකෝණේ ඉන්න අපි ඔවුන්ව ලිපියක් මඟින් හෝ දැනුවත් කරමු කියලා මම මේ අවස්ථාවේ කියනවා.බොහෝම ස්තුතියි.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා - (ජ.වි.පෙ.)</u>

ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව ස්ථිර කරමින් විශේෂයෙන්ම පඬුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලේ පොල් හා පොල් ආශ්‍රිත කර්මාන්තවල යෙදෙන හා ජීවත්වෙන එය රැකියාව කරගත් විශාල පිරිසක් ඉන්නවා. අද දවසේ ඔවුන් මුහුණ දීලා තියෙන්නේ බැරෑරුම් අර්බුදයකට. ඒ අර්බුදයෙන් ගොඩ එන්න කොතෙක් කල් යයිද හිතාගන්න බැරි හේතුව තමයි අපේ රටට ගලා ආ විදේශ විනිමය දැන් එන්න එන්න හීනවෙනවා මේ තිබෙන තත්ත්වයත් එක්ක.දවසින් දවස අපේ රටේ පොල් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන කළ පිරිස වෙනත් රටවල්වලට පිටමංවෙමින් තිබෙනවා. සභාවක් විදියට ඒ නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්තවලින් විශාල ආදායමක් අපට ලැබෙනවා.ඒ වගේම රටටත් විශාල සේවයක් සිදුවෙනවා.මේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයටත් විශාල සේවයක් සිදුවෙනවා. පසුගිය කාලේ අමාත්‍යාංශ ගණනාවක සාකච්ඡා තිබුණා පොල් ගස රැක ගන්න. විශේෂයෙන්ම පොල් ගස් කැපීම තහනම් කළා. ඒ නීතිය දැන් ක්‍රියාත්මක වෙමින් පවතිනවා. ඒ වගේම මේ පොල් සම්බන්ධ කර්මාන්ත රැක ගන්න විශාල උත්සාහයක යෙදුණා. මේ ක්ෂේත්‍රයේ නියළිලා ඉන්න විශාල ප්‍රමාණයක් දැන් අසීරුතාවයට පත්වෙලා තියෙනවා. ඒ නිසා විශේෂයෙන්ම මේ ගැන සැලකිල්ලට ලක් කරලා මේ කර්මාන්ත රැකගැනීම සඳහා රජයේ අවධානය යොමු කරවන්න ක්‍රියාමාර්ගයක් ගන්න. විශේෂයෙන්ම වැවිලි කර්මාන්ත හා අපනයන කෘෂිකර්ම අමාත්‍යාංශයේ අවධානය යොමු කරවන්න. එමඟින් විදෙස් විනිමය ගමට ගේන්න දායකත්වය ලබාදෙමුයි මම නිහඬ වෙනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

කොහු සහ කොහුබත් ආශ්‍රිත කර්මාන්තයේ කඩා වැටීම සම්බන්ධ විශේෂ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව කොහු සහ කොහුබත් ආශ්‍රිත කර්මාන්තයේ කඩා වැටීම සම්බන්ධ විශේෂ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## IV. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඩී.නිමාලි දිල්හානී මෙනවියගේ පියාගේ අභාවය වෙනුවෙන් සංවේගය ප්‍රකාශ කිරීම.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඩී.නිමාලි දිල්හානී මෙනවියගේ පියා පසුගියදා අභාවයට පත්වුණා.ඊට අපි සාතිශය සංවේගය ප්‍රකාශ කරනවා. එතුමිය වෙනුවෙන් ඒ පියාගේ අවසන් කටයුතු සඳහා ප්‍රාදේශීය සභාවේ අපේ ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා කිහිපදෙනෙක්ම ඒ අවස්ථාවට සහභාගී

වුණා. නැවත වරක් ප්‍රාදේශීය සභාවේ අපේ ගරු මන්ත්‍රීතුමන්ලා,ලේකම්තුමා ඇතුළු කාර්යයමණ්ඩලය සියලුමදෙනා ගරු මන්ත්‍රීතුමියගේ පියා වෙනුවෙන් සාතිශය සංවේගය ප්‍රකාශ කරනවා. එතුමියට අවස්ථාව ලබා දෙනවා අදහස් ප්‍රකාශ කරන්න.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී ඩී.නිමාලි දිල්හානී මෙනවිය- (පො.ජ.පෙ.)</u>**
සියලුදෙනාගෙන්ම අවසරයි. ප්‍රථමයෙන්ම ලැබුවාවූ නව වසර සාමය සතුට පිරුණු සුබ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරනවා. 2011 දී මන්ත්‍රීවරියක වෙලා මම මේ සභාවට පය තබනකොට අම්මා නැති මට තනියට හිටියේ මගේ තාත්තා. අද දවස මේ සභා වාරයේ අවසන් දිනය විය හැකියි.පසුගියදා මගේ තාත්තා හදිසියේම නැතිවුණා. පැය 6ක් වගේ කාලයක් පියා නැතිවෙලා ගෙදර ඉඳලා තියෙනවා. මොකද මම පාසලේ රැකියාවට ගිහින් හිටියේ. මගේ තාත්තා ගෙදර තනියෙන් හිටියේ. බලු සුරතලා විතරයි හිටියේ. මම අවමංගල්‍ය කටයුතුවලට මම සභාපතිතුමාට කතා කළා. එතුමා ඒ වෙලාවේම ආවා. ඒ වගේම ගෞරවනීය මන්ත්‍රී මණ්ඩලයේ බොහෝ දෙනෙක් ආවා. ඒ හැමෝටම මම පිං දෙනවා මගේ දුක බෙදාගන්න මගේ ගෙදරට ආවාට. ලේකම්තුමා ප්‍රධාන කාර්යයමණ්ඩලයේ නිලධාරී මහත්ම මහත්මීන් ඒ අයටත් ස්තූතිවන්තවෙනවා සහ පිං දෙනවා. එදා උදේ රාජකාරියට කුරුණෑගල රෝහලට ගිහින් හිටිය වෙලේත් ගෙදරට ගරු මන්ත්‍රීවරු පිරිසක් ඇවිත් තිබුණා. නමුත් හිටියේ මගේ අක්කා. ඇයව හඳුනන්නේ නැතිව ඇති. මගේ දුක බෙදාගන්න ආව හැමෝටම පිං. ඒ දවසේ අඩුපාඩුවක් සිදුවුණා නම් සමාව ඉල්ලා සිටිනවා. ඒ මොහොතේ මට ශක්තියක් වුණ ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයට ස්තූතිවන්ත වෙනවා. ලේකම්තුමා ප්‍රධාන කාර්යයමණ්ඩලයේ අයටත් ස්තූතිවන්ත වෙනවා.ඒ සංවේදී අවස්ථාවේ කරපු උදව් උපකාරවලට මගේ පියා වෙනුවෙන් හැමෝටම ස්තූතිය පුද කරමින් පිං දෙනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**
ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී ඩී.නිමාලි දිල්හානී මෙනවියගේ පියාගේ අභාවය වෙනුවෙන් නැවතත් ප්‍රාදේශීය සභාවේ සාතිශය සංවේගය ප්‍රකාශ කරනවා.

**ඒ අනුව ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී ඩී.නිමාලි දිල්හානී මෙනවියගේ පියාගේ අභාවය වෙනුවෙන් ප්‍රාදේශීය සභාවේ සාතිශය සංවේගය ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.**

## 06. කාරක සභාවල වාර්තා සහ එම වාර්තා එවෙලේම සලකා බැලීමට ප්‍රාදේශීය සභාව තීරණය කරන්නේ නම් මිස ඒවා සලකා බැලීම සඳහා දිනයක් නියම කිරීම.

### I. 2022.12.08 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය, කාර්මික සේවා, පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව මහා සභාවට ඉදිරිපත් කිරීම.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**
2022.12.08 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා - (එ.ජා.ප.)</u>**
2022.12.08 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා - (පො.ජ.පෙ.)</u>**
2022.12.08 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**
2022.12.08 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022.12.08 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## II. 2022.12.22 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය, කාර්මික සේවා, පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව මහා සභාවට ඉදිරිපත් කිරීම.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**
2022.12.22 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය - (එ.ජා.ප.)</u>**
2022.12.22 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා - (එ.ජ.නි.ස.)</u>**
2022.12.22 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.
**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**
2022.12.22 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022.12.22 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## III. හෙට්ටිපොල මහජන ක්‍රීඩාංගනය සම්බන්ධ තාවකාලික තක්සේරුවක් සඳහා වන කමිටු පත් කිරීමේ වාර්තාව මහා සභාවට ඉදිරිපත් කිරීම.
**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**
හෙට්ටිපොල මහජන ක්‍රීඩාංගනය සම්බන්ධ තාවකාලික තක්සේරුවක් සඳහා වන කමිටු පත් කිරීමේ වාර්තාව සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා**

හෙට්ටිපොල මහජන ක්‍රීඩාංගනය සම්බන්ධ තාවකාලික තක්සේරුවක් සඳහා වන කමිටු පත් කිරීමේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා - (එ.ජා.ප.)**

හෙට්ටිපොල මහජන ක්‍රීඩාංගනය සම්බන්ධ තාවකාලික තක්සේරුවක් සඳහා වන කමිටු පත් කිරීමේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

**හෙට්ටිපොල මහජන ක්‍රීඩාංගනය සම්බන්ධ තාවකාලික තක්සේරුවක් සඳහා වන කමිටු පත් කිරීමේ වාර්තාව** සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව හෙට්ටිපොල මහජන ක්‍රීඩාංගනය සම්බන්ධ තාවකාලික තක්සේරුවක් සඳහා වන කමිටු පත් කිරීමේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ සභා සම්මත විය.**

## IV. හෙට්ටිපොල මහජන ක්‍රීඩාංගනය ගිවිසුමක් යටතේ මාසික ගාස්තුවක් අය කිරීමේ පදනම මත කුරුණෑගල දිස්ත්‍රික් ක්‍රිකට් සංගමය වෙත ලබාදීම සම්බන්ධව.

## උප ලේඛන- 01.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

### හෙට්ටිපොල මහජන ක්‍රීඩාංගනය බදු දීම සම්බන්ධ කමිටු නිර්දේශ -2022.12.22

**සහභාගීත්ව කමිටු සාමාජික නාම ලේඛනය**

- බී එම්.ධර්මසේන බමුණුසිංහ මහතා -ගරු සභාපති
- රංජිත් ආනන්ද බණ්ඩාර මහතා -ගරු උප සභාපති
- කේ.එම්.නන්දසිරි මහතා -ගරු ප්‍රා/සභා මන්ත්‍රී
- ඒ.ජී.ඩී.රංජිත් ප්‍රේමලාල් මහතා -ගරු ප්‍රා/සභා මන්ත්‍රී
- එච්.එම්.ජයන්ත හේරත් මහතා -ගරු ප්‍රා/සභා මන්ත්‍රී
- කේ.කේ.නිමල් දයානන්ද මහතා -ගරු ප්‍රා/සභා මන්ත්‍රී
- එස්.එම්.ෆයිසර් මහතා -ගරු ප්‍රා/සභා මන්ත්‍රී
- ඩී.එම්.එස්.දිසානායක මහතා -ගරු ප්‍රා/සභා මන්ත්‍රී
- දේශප්‍රිය ජයලත් මහතා -ගරු ප්‍රා/සභා මන්ත්‍රී

**සහභාගී නොවූ කමිටු සාමාජික නාම ලේඛනය**

- වයි.ජී. සංජීව කරුණාසාගර -ගරු ප්‍රා/සභා මන්ත්‍රී
- ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක -ගරු ප්‍රා/සභා මන්ත්‍රී

01. මහජන ක්‍රීඩාංගනය වාර්ෂික පදනම මත දෙවන පාර්ශවයට බදු දෙනු ලැබේ.
02. සභාව ඉල්ලා සිටින ඕනෑම අවස්ථාවක සභාවේ කටයුතු වෙනුවෙන් ක්‍රීඩාංගනය ආපසු ලබා දිය යුතුය.
03. හෙට්ටිපොල මහින්දෝදය ජාතික පාසලේ සියළු වැඩ කටයුතු සඳහා (සංගීත සංදර්ශන හැර) අය කිරීමකින් තොරව ක්‍රීඩාංගනය ලබා දිය යුතුය.
04. උදේ සහ සවස් කාලයේ ශරීර සුවතා හා ක්‍රීඩා පුහුණුවීම් කටයුතු වලට ප්‍රදේශවාසී ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ක්‍රීඩාංගනය ලබාදිය යුතුය.
05. පාපන්දු,ක්‍රිකට් සහ සැහැල්ලු පන්දු තරඟ සඳහා වෙන් කරනු ලබන සීමාව ඇතුළත ප්‍රදේශවාසී ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ක්‍රීඩාකිරීම පිණිස අය කිරීමකින් තොරව ලබාදිය යුතුය.
06. බදු කාල සීමාව තුල බදුකරුවන් විසින් නඩත්තු කටයුතු සිදු කළ යුතුය.උදා:-
    - තණකොළ කැපීම

- වතුර ගැසීම
- ක්‍රීඩාගාරයේ නඩත්තු කටයුතු
- විදුලි බිල,ජල බිල ගෙවීම
- විදුලි පද්ධති, විදුලි උපකරණ , පරිපථ බිඳවැටුන විට නඩත්තු කටයුතු

07.කසළ බැහැර කිරීම පමණක් සියළු අපද්‍රව්‍ය ගේට්ටුව අසළට ගෙනවිත් දුන්පසු පළමු පාර්ශවය විසින් ඉවත් කරනු ලැබේ.

08.ක්‍රීඩාගාරය සහ ක්‍රීඩාංගනය සතුව පවතින භෞතික සම්පත්, විදුලි පද්ධති, පරිපථ,විදුලි උපකරණ කැඩී බිදී ගියහොත් ඒවා නඩත්තු කළ යුතුය.

09.සභාවේ නිළධාරීන්ට, සභාපතිතුමාට, මන්ත්‍රීවරුන්ට ක්‍රීඩාංගනයේ කුමන හෝ අධීක්ෂණ කටයුතු වලට අවස්ථාව තිබිය යුතුය.

10.ක්‍රීඩාංගනය භාරදුන් අවස්ථාවේ පවතින ලෙසටම ගිවිසුම් කාල සීමාව අවසන් වනතුරු කිසිදු අලාභහානිවීමක් සිදු නොවිය යුතුය. අලාභහානිවීම් සිදුවුවහොත් නීත්‍යානුකූලව කටයුතු කිරීමේ බලය සභාව සතුය.

11.වත්කම් බදු දීමේ සාමාන්‍ය කොන්දේසි දෙවන පාර්ශවයට අදාල වේ.

12.ඉදිරි වර්ෂයට බදු දෙන්නේද නැද්ද යන තීරණය සභාව සතුය.

13.ක්‍රීඩාංගනයේ යම් අභ්‍යන්තර සවිකිරීම් වෙනස් කිරීම් කටයුතු සඳහා පළමු පාර්ශවයේ අවසරය ලබා ගත යුතුය.

14.මාසික ගාස්තුව මෙන් සිව්ගුණයක තැන්පතුවක් මූලිකව තැන්පත් කළ යුතුය.

15.ගැටළු සමථ කිරීම් සහ මැදිහත්වීම් සඳහා පළමු පාර්ශවයේ මැදිහත්වීම ඇත.

## <u>හෙට්ටිපොල මහජන ක්‍රීඩාංගනය බදු දීම සම්බන්ධයෙන් දිස්ත්‍රික් ක්‍රිකට් සංගමයේ සභාපති ඇතුළු නිළධාරීන් සමඟ 2022/12/29 දින කළ සාකඡාවට අදාල වාර්තාව</u>

<u>සහභාගී වූ සාමාජික නාම ලේඛනය</u>

| | | |
|---|---|---|
| 1.එච්.ඒ.ජී.නිශ්ශංක | ලේකම් | පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව |
| 2.කේ.එම්.නන්දසිරි | ප්‍රා/සභා මන්ත්‍රී | පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව |
| 3එස්.එම්.ෆයිසර් | ප්‍රා/සභා මන්ත්‍රී | පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව |
| 3.ජේ.පී.ඩී.ආර්.ජයසේකර | සභාපති | හෙට්ටිපොල ක්‍රීඩා සමාජය |
| 4.ඒ.එම්.සිද්දික් | සභාපති | කුරු/දිස්/ක්‍රිකට් සංගමය |
| 5.කේ.පී.ඩී.ඩබ්.එස්.පතිරණ | විධායක ලේකම් | H.M.V. |

හෙට්ටිපොල මහජන ක්‍රීඩාංගනය බදු දීම සම්බන්ධව 2022/12/13 දින මහ සභාව විසින් පත්කල කමිටුවේ නිර්දේශ අංක 01 සිට 15 දක්වා අදාල කරුණු සාකච්ඡාවට බඳුන් කල අතර එම කරුණු පිළිගැනීමට දිස්ත්‍රික් ක්‍රිකට් සංගමයේ නිළධාරීන් එකඟතාවය පල කරන ලදී.

තව ද අදාල සාකච්ඡාවේදී ප්‍රාදේශීය සභා කමිටුව ඉදිරිපත් කළ නිර්දේශ වලට අමතරව පහත සඳහන් කරුණු ද එක් කරන ලෙස යෝජනා කරන ලදී.

01. මහජන ක්‍රීඩාංගනයේ කටයුතු සම්බන්ධයෙන් විනිවිදභාවයෙන් යුතුව අදාල කාර්යයන් ඉටු කිරීමට අධීක්ෂණ කමිටුවක් පත් කිරීම.
ඒ සඳහා පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා,ලේකම්,වැඩ අධිකාරී, හෙට්ටිපොල මහින්දෝදය ජාතික පාසලේ විදුහල්පති,දිස්ත්‍රික් ක්‍රිකට් සංගමය නියෝජනය කරන තනතුරු 02 ක් හෙට්ටිපොල "යූත්" ක්‍රීඩා සමාජය නියෝජනය කරන තනතුරක් වශයෙන් අධීක්ෂණ කමිටුව සමන්විත විය යුතුය.

02.පැය 24 පුරා සේවය කරන මුරකරුවෙකු දෙවන පාර්ශවය විසින් යෙදවිය යුතුය.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ජයන්ත හේරත් මහතා - (පො.ජ.පෙ.)</u>**

ලැබුවාවූ නව වසර සුබ නව වසරක් වේවා සියලුදෙනාටම.2022.12.22 කමිටුව සඳහා මම සහභාගී වුණේ ඇත්තටම මම සහභාගී වුණේ ක්‍රීඩාංගනය බදුදීම නිසා හෙට්ටිපොල ප්‍රදේශයේ ඉන්න තරුණ පිරිසට යම් අසාධාරණයක් වෙයි, ඒ සඳහා කරුණු කාරණා ඉදිරිපත් කරන්න සහ මෙයට ඇතුළත් කරන්න තමයි මෙයට සම්බන්ධ වුණේ. අපි එදා කතා කල කරුණුත් එක්ක උඩින්ම තියෙනවා හෙට්ටිපොල මහජන ක්‍රීඩාංගනය බදුදීම කියලා. මට මතකයි 2002 දී වගේ සභාවේදී මෙයට නමක් අනුමත කර ගත්තා ආර්.එම්.කේ.බී. රත්නායක ක්‍රීඩාංගනය කියලා. අනික තමයි උදේ සහ සවස් කාලේ ශරීර සුවතා හා ක්‍රීඩා කටයුතුවලට අවසර ලබා දීම කියලා. නමුත් බදු ගන්න අයට පුළුවන් උදේ 7.00 ඉඳලා 8.00 වෙනකල් විතරයි කියලා ගේට්ටුව වහලා දාන්න.මෙහි වෙලාවක් සඳහන් කරලා නෑ. ඊළඟට මෙහි පාපන්දු හා සැහැල්ලු ක්‍රිකට් ගැන කතා කරනවා. නමුත් මේ දිස්ත්‍රික්කේම ජයග්‍රාහී කබඩි කණ්ඩායම ඉන්නේ හෙට්ටිපොල.කබඩි සඳහා මේ කමිටුවේ නිර්දේශයෙන් කිසිම දෙයක් නෑ. විශේෂයෙන් මම මෙයට සම්බන්ධ වුණේ මොනයම් හේතුවකින් හරි මේ කමිටුව දෙන නිර්දේශ ගිවිසුමට ඇතුළත් කරලා ගිවිසුම්ගත වෙයි කියලා. නමුත් මම පෞද්ගලිකව හෙට්ටිපොල කොට්ඨාශේ ජනතාවගේ නියෝජිතයා විදියට මෙම ක්‍රීඩාංගනය බදු දෙනවාට මම විරුද්ධයි. ඒ වගේම විශේෂයෙන්ම කිවයුතුයි වෙලගෙදර ක්‍රීඩාංගනය ආපසු නගර සභාවට පවරා ගන්න යනවිට කුරුණෑගල ක්‍රිකට් සංගමය හා මහානගර සභාව අතර ගැටුමක් ඇතිවෙලා තිබෙනවා ඉදි කිරීම්වල මුදල් ඉල්ලා. ක්‍රිකට් සංගමය බදු ගත්තාම ක්‍රිකට් ඇකඩමිය පුහුණුවීම් කරන්න ගත්තම අපි ලබාදෙන කොටසේ පාපන්දු ගහන්න බෑ. ලෙදර් ක්‍රිකට් පුහුණුවීම් කරනකොට බෝල වැදිලා තුවාල වෙන්න පුළුවන්. ඒ නිසා වෙන පුහුණුවීම් කරන්න බෑ ඒ වෙලාවේදී. ඒ වගේම කබඩි පුහුණුවීම් කරන්න බෑ. ඉස්සර අන්තර් පාසල් තරඟ තිබුණා මට මතකයි.දිස්ත්‍රික් ලේකම් කාර්යාලේ ක්‍රීඩා තරඟ පැවැත්තුවා. ගිවිසුමට බදු දීම ඇතුළත් වුණොත් මේවා කිසිම දෙයක් කරන්න බෑ. කමිටුවට ඇවිත් ගියාම හෙට්ටිපොල කොට්ඨාශේ හා අවට ඉන්න අය මේ සම්බන්ධයෙන් දැඩි විරෝධයක් කළා. ඒ නිසා ගිවිසුම් ගත වෙනවට මම විරුද්ධයි. මම දන්නා තරමට අනුන්ගේ ඉඩමකට අපිට කා එක්කවත් ගිවිසුම්ගත වෙන්න බෑ. මේකේ අයිතියක් නෑ අපට. අයිතිය තිබෙන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයට. දැන් කියනවා ප්‍රාදේශීය සභාවට මෙය පැවරුවා නඩත්තු කටයුතු හා වැඩි දියුණු කිරීම් සඳහා කියලා. එක එක පාර්ශව සමඟ ගිවිසුම් ගතවෙන්න පවරලා නෑ.2012 පළාත් අධ්‍යක්ෂ අමාත්‍යාංශයෙන් ලිපියක් එවලා තියෙනවා ප්‍රාදේශීය සභාවට ආපසු භාරදෙන්න කියලා මෙය. නමුත් ඒක දිගින් දිගට ක්‍රියාත්මක වුණේ නැ. හිටපු විදුහල්පතිවරු,ආදි ශිෂ්‍ය සංගම් ක්‍රියාත්මක නොවුණු නිසා. ක්‍රීඩාංගනේ ගැටලුවක් නොතිබුණු නිසා. සියලු දේ හොඳින් සිදු වූ නිසා ගැටළුවක් වුණේ නෑ. 2012 ලිපියක් දීලා තියෙනවා මේක ආපසු පවරා දෙන්න කියලා. මේක අපිට අයිති නෑ. ඒ නිසා මම මේකට කොහොමත් විරුද්ධයි. අවසානේ සභාවේ හිටපු මන්ත්‍රීවරු කියලා අපිට චන්දිත් ගෙවන්න වෙයි. අවසානේ පාසල් තීන්දු තීරණ ගත්තාම අවසානේ මොකද්ද ප්‍රතිඵලේ කියලා අපි දන්නේ නෑ. ඒ සම්බන්ධයෙන් මම සම්බන්ධීකරණ කමිටුවටත් ලිපියක් ඉදිරිපත් කරනවා. මේ ක්‍රීඩාංගනය

හෙට්ටිපොල අනන්‍යතාවය හා හදවත වගේ තිබුණ ක්‍රීඩාංගනයක්. මේ අවට ක්‍රීඩකයෝ ලෙදර් ක්‍රිකට් ගහන්නේ නෑ. ඊට වත්කම් නෑ. විශාල වියදමක් යනවා මේ ක්‍රීඩාවට. අලුත් පරපුරට මේ සඳහා උපකරණ ගන්න විශාල මුදලක් වියදම් කරන්න විදියක් නැහැ.දැන් මේ ක්‍රිකට් බෝර්ඩ් එකත් එක්ක සම්බන්ධවෙලා කරන්නේ මුදල් හම්බ කිරීමේ වැඩක්. මේක බොහෝම කුමන්ත්‍රණකාරී ලෙස සැලසුම් කරලා කරන වැඩසටහනක් විදියට මම දකින්නේ. මම මේ ගරු මන්ත්‍රීතමන්ලාගෙන් හා තුමියන්ලාගෙන් බොහෝම ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා දේශපාලනය, පක්ෂ, පාට ගැන හිතන්න නැතුව, බුදුන්ට අම්මාට තාත්තාට වඳින අත්දෙක උස්සලා මට මේ ක්‍රීඩාංගනය රැක ගන්න සහාය දෙන්න කියලා.මෙයට මම විරුද්ධයි. ඒ නිසා මම බෙදීමක් යෝජනා කරනවා ගරු සභාපති තුමනී.

<u>**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.ඩබ්.බී.එම්.ඉන්දික ප්‍රදීප් රාජගුරු මහතා - (පො.ජ.පෙ.)**</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.ආර්.එම්.අපර්ණ නිලුපුල් සේනාරත්න මහතා - (එ.ජ.නි.ස.)**</u>

සියලුදෙනාගෙන්ම අවසරයි. ජයන්ත හේරත් ගරු මන්ත්‍රීතුමා දුක් ගැනවිල්ලක් ඉදිරිපත් කළා.දෙවියන්ට කණ්නලවු කළා. වැඳලා ඉල්ලුවා. මහජන ක්‍රීඩාංගනය බඳු දීම සම්බන්ධව කමිටු වාර්තාව විදියට ඉදිරිපත් කරලා තිබුණා.එතුමා කීව ක්‍රීඩා ටික ඇතුළත් කරලා මේ ක්‍රීඩාංගනය පවත්වාගෙන යනවද නැද්ද කියන කාරණය තමා යෝජනා කරන්නේ. අපි අවශ්‍ය ප්‍රතිපාදන ක්‍රිකට් පාලක මණ්ඩලයේ අරමුදල් වෙන් කරලා අපි නඩත්තු කරගෙන යනවාද? එයට ශක්තියක් තියෙනවාද? අපි මෙය ජාත්‍යාන්තර මට්ටමට ගෙනාවේ නැද්ද? ගෙනල්ලා තියෙනවා.මොකද මේක මෙතුමා කියන විදියට පඩුවස්නුවර ඉන්න අයට ලෙදර් ක්‍රීඩා කරන්න ශක්තියක් නෑ. එහෙම නම් සනත් ජයසූරිය ට ක්‍රිකට් ගහන්න අද බෑ. මොකද අඩුපාඩු කිය කිය හිටියානම් ඔය කියන ක්‍රීඩකයෝ බිහිවෙන්නේ නෑ.මේ රටේ හැම ක්‍රීඩාවකටම එකම විදියට සැලකීම ලැබෙනවා අඩුයි. මළල ක්‍රීඩාව ගත්තොත් දුවන ක්‍රීඩකයා තමන් පුහුණු වෙලා තමන්ම සපත්තු හොයාගෙන ජාත්‍යන්තරය ජයගන්නා තුරු අනුග්‍රාහකයෝ නැතුව

ක්‍රීඩකයෝ ඉන්නවා. නමුත් දිනලා ආවම ඇති තරම් අනුග්‍රාහකයෝ ඉන්නවා අවශ්‍ය දේවල් සපයා දෙන්න. ලංකාවේ අනෙක් ක්‍රීඩා සංගම්වලට වඩා ක්‍රිකට් පාලක මණ්ඩලයට විශාල ආදායමක් තියෙන ආයතනයක්. ක්‍රීඩා අමාත්‍යවරයා විදියට දයාසිරි ජයසේකර මැතිතුමා පසුගිය කාලේ පඩුවස්නුවර ආසනේ ක්‍රීඩාංගන ගණනාවක් සංවර්ධනය කළා. මේ ආසනේ පුරාම විශාල ප්‍රමාණයක් ක්‍රීඩාංගන තියෙනවා. හෙට්ටිපොල මධ්‍ය විද්‍යාලය, පඩුවස්නුවර ජාතික පාසල මේ වගේ නම ගිය පාසල් ගණනාවක දරුවෝ ක්‍රිකට් ක්‍රීඩා කරනවා.ඔවුන්ට මෙයින් ප්‍රතිලාභ ලබන්න පුළුවන්. මේ සම්බන්ධ ගිවිසුමකට එන්නේ නැතිව මෙය නඩත්තු කරන්න සභාවේ සල්ලි වෙන් කරලා සභාවක් විදියට මේ ක්‍රීඩාංගනය ගෙනියන්න ශක්තිය ආදායම තියෙනවාද බලලා අපිට පුළුවන් නම් මුදලක් තක්සේරු කරලා සභාවට ආදායමක් එන විදියට හදලා මුරකරුවන්ට පඩි වෙලා ඊට ශක්තියක් අපිට නැතිනම් දෙවැනි පාර්ශවයට සම්බන්ධ කරලා දෙනවානම් එයින් යම්කිසි මුදලක් සභාවටත් ලැබෙනවා. මේ ක්‍රීඩාංගනය ජාත්‍යාන්තර ක්‍රීඩා කරන මට්ටමට ගෙනත් තියෙනවා.ඒ නිසා තවත් ක්‍රීඩා පිළිබඳ කොන්දේසි ඇතුළත් කරලා තක්සේරු කිරීම් තවත් හොයලා බලලා මෙයින් සභාවට ආදායම් එන විදියට අහිංසක දරු දැරියන්ට සෙල්ලම් කරන්න පුළුවන් අවස්ථාව හදලා දෙන්න.

<u>**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ජයන්ත හේරත් මහතා - (පො.ජ.පෙ.)**</u>

ගරු සභාපතිතුමා, මගේ නම කියලා මේ වගේ කුහක චෝදනා කරන්න එපා කියලා කීව නිසා මම කියන්නේ, මම මේ කුහකවත් දේශපාලන භේදයකින්වත් බලලා නෙවෙයි මේ යෝජනාව ගෙනාවේ.හෙට්ටිපොල ප්‍රදේශයේ සිංහල හා මුස්ලිම් ගැටුම් ඇති වුණ අවස්ථාවේ වුණත් විශාල ගැටළුවක් ඇතිවුණේ නෑ.මොකද මේ ක්‍රීඩාව නිසා ඇතිවුණ සහෝදරත්වය නිසා. අපි සිංහල මුස්ලිම් දෙමළ හැමෝම එකතුවෙලා හවසට මෙතැන ක්‍රීඩා කරනවා. මම කතා කළේ හෙට්ටිපොල ජනතාවගේ අයිතිය ගැන.

<u>**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා ,ඔබතුමාට අදහස් ඉදිරිපත් කරන්න අවස්ථාව දුන්නා.අනිත් මන්ත්‍රීවරුන්ට අදහස් ඉදිරිපත් කරන්න අවස්ථාව දෙන්න. අපි හෙට්ටිපොල ජනතාවට අසාධාරණයක් වෙන්න දෙන් නෑ.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා - (ජ.වි.පෙ.)</u>**

ගරු සභාපතිතුමනි, හෙට්ටිපොල ක්‍රීඩාංගනය ගැන කතා කරද්දී අපිට වැදගත්වෙන්නේ ක්‍රීඩාව. මෙතැන ක්‍රීඩාව කියන්නේ මිනිසුන්ට අදාළ කාරණාවක්. ශරිර යෝග්‍යතාවය ,ශරිර සුවතාව පවත්වාගෙන යන්න ක්‍රීඩාව අත්‍යාවශ්‍යයි. ඒ වගේම කලාව, සංස්කෘතියත් අත්‍යාවශ්‍යයි. මානසික සුවතාව පවත්වාගෙන යන්න කලාව කියන්නේ ඉතා අත්‍යාවශ්‍ය දෙයක්. මම මේ ඉදිරිපත් කරන්න යන කාරණාව යෝජනා කරලා තියෙන්නේ හෙට්ටිපොල මහජන ක්‍රීඩාංගනය ක්‍රිකට් පාලක මණ්ඩලයට දෙන්න නෙවෙයි. ක්‍රිකට් ක්ලබ් එකක් සමඟ ගිවිසුමකට යන්න. ඉතින් අපි මේ ගැන සොයා බැලුවා සාමාන්‍ය ක්‍රමවේදය මොකද්ද කියලා.ඊට ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ ඉන්න අපේ සහෝදරයා උදව් කළා. ඔහු ක්‍රිකට් පුහුණුකරුවෙක්. ඔහු මේ ගැන තොරතුරු කීවා.එතකොට සභාවේ අපිට පුළුවන් ක්‍රිකට් සංගමයට බදු දෙන්න නෙවෙයි ගිවිසුමකට යන්න. ගිවිසුමකට ගිහිල්ලා ඔයගොල්ලෝ ක්‍රිකට් ක්‍රීඩා පිටිය භාවිත කරන්න. ඒ වෙනුවෙන් අපිට මුදලක් දෙන්න. නමුත් ක්‍රීඩා පිටියේ වගකීම අපි සතුයි. ඔබ මේ ක්‍රීඩා පිටිය ඇවිත් පාවිච්චි කරන්න. කොන්දේසි අනුව ඉදි කිරීම් කටයුතු කරන්න පුළුවන්. ඒ ඉදි කිරීම් කටයුතු පසුව ගලවන් යනවද නැද්ද තීරණය කරන්න බෑ. ඒ නිසා මේ ගිවිසුම් ගතවෙන්න යන්නේ ක්‍රිකට් පාලකය එක්ක. එතකොට අවුරුද්දකට බදු ගෙවනවා. ඉතින් අපිට ළඟම තියෙන ක්‍රීඩාංගනයට අපේ හිතවතුන්ගේ දරුවෝ ක්‍රිකට් ගහන්න එනවා. එතැන පුහුණු කරුවෙක්ඉන්නවා. පුහුණු කරනවා කියලා රු.500.00ක මුදලක් ගන්නවා. දැන් මේ සූදානම් වෙලා තියෙන්නේ, පළාත් පාලන ආයතනවල කාලය ඉවර වෙලා. පෙබරවාරි වල ඡන්දය තිබුණත් නැතත් මෙය අහෝසියි. ඒ නිසා මෙම කරුණ යාවත්කාලීන කරන්න ගිවිසුමකට යනවා. මේ යෝජනාව සභාවට ආවේත් වෙස් වළාගෙන. ඉතින් සමහර මන්ත්‍රීවරු මේකට විරුද්ධව කතා කරලා පස්සේ කැමතියි වගේ කතා කරනවා. සභාවට මුලින් දාලා පස්සේ කමිටුවක් පත් කරනවා. කමිටුව පත් කිරීමේ පදනම ම මේක බදුදෙනවාද නැද්ද යන්න නෙවෙයි. බදු දීම සඳහා කොන්දේසි පැනවීමට තමයි කමිටුව පත් කළේ. සමහරවිට දැන් බදු දෙන්න සූදානම් කරලා තියෙන්නේ.උදාහරණයකට ගත්තේ වෙලගෙදර ක්‍රීඩාංගනේ ක්‍රිකට් පාලක සංගමයට ලබා දීම. දැන් නගර සභාවෙන් පවරගෙන තියෙනවා. වෙලගෙදර ක්‍රීඩාංගනේ ඔය කියන සුරපුර, දිව්‍ය ලෝකේ නෑ.ක්‍රිකට් ගහන එක විතරක් නෙවෙයි. ඒ නිසා අපි එකඟතාවයකට, ගිවිසුමකට යමු. බදු දීමකට නෙවෙයි. අපි අයිතිය තියාගෙන, ඔයගොල්ලෝ පාවිච්චි කරන්න. ඒකට මුදලක් දෙන්න. හැබැයි ක්‍රිකට් පාලක මණ්ඩලයට නෙවෙයි, ක්‍රිකට් ක්ලබ්වලට නෙවෙයි, ක්‍රීඩා සමාජවලට නෙවෙයි. මෙයින් මූලිකව පෙන්වන්න හදන්නේ ක්‍රීඩාවේ අවශ්‍යතාවයනේ. සුදු අලියෙක් කියලානේ. ක්‍රීඩා පිටියක් කියන්නේ නඩත්තු කරන එකක්, මුදල් බලාපොරොත්තුවෙන එකක් නෙවෙයි.ඊට වඩා සභාවේ මොන තරම් නඩත්තු කරනවාද ? මොන තරම් මුදල් වියදම් වෙනවාද? විනිසුරුතුමා මට කියනවා මුදල් එනවා.දැන් යෝජනා කරනවා පඩියකට මුරකරුවෙකු දාන්න. කවුද අදාළ ක්‍රීඩා සමාජයෙන්. මේවා වෙනවාද? නැනේ. ප්‍රාදේශීය සභාවට මුරකරුවෙකු දාලා තියෙනවා. අපේ ආයතනවලට, පොළට මුරකරුවෙකු දාලා තියෙනවා. ක්‍රීඩාවට, කලාවට, සංස්කෘතියට යොදවන දේ නැවත මහජනතාවගේ සුබ සිද්ධිය සඳහා වන එය මහජන උපයෝගීතාවය, අවශ්‍යතාවය. ඒ අවශ්‍යතාවයට කටයුතු කරනවා විනා මේක අයිති අධ්‍යාපන අමාත්‍යාංශයට ද පඬුවස්නුවර ප්‍රාදේශීය සභාවට ද කියන දේ පසුව බේර ගමු. ප්‍රාදේශීය සභාවට තියෙනවානම් හොඳයි මොකද ඒ ආදායම එන්නෙ ප්‍රාදේශීය සභාවටනේ. ඒක හොඳයිනේ. හැබැයි ප්‍රදේශයේ දරුවන්ට ක්‍රිකට් විතරක් නෙවෙයි අනෙකුත් ක්‍රීඩාවලට සම්බන්ධවෙන දරුවන්ට ඉඩකඩ ප්‍රස්තාව සලසන්න අවශ්‍යයි. මුදල්වල ඉලක්කයක් නොතබා වගේම ආදායමක් ලබා ගන්නවානම් ඒ ආදායම පඬුවස්නුවර ප්‍රාදේශීය සභාවට ලබා ගමු. ඒ නිසා ක්‍රීඩා අමාත්‍යාංශයේ මුදල් ගෙනල්ලා මේක සංවර්ධනය කළා කියලා මතවාද හදන්න හදනවානම් ඒ◌ෙක වෙන දෙයක් තියෙන්නේ.

ක්‍රීඩා අමාත්‍යාංශයේ මුදල් පෞද්ගලික මුදල් නෙවෙයි, ඒවා මහජන මුදල්. දේශපාලකයෝ කිහිපදෙනෙක්ට, වටේ ඉන්න කිහිපදෙනෙකුට ගොඩ යන්න, සාක්කුවට කීයක් හරි දාගන්න සංවර්ධනය කරනවා කියන ඉලක්කය එය නම් සංවර්ධනය කියන එකේ අරමුණ ඒක නම් ඒ සංවර්ධනය පුද්ගලිකයි. ඒ සංවර්ධනය ජනතාව ප්‍රතික්ෂේප කරනවා. සභාපතිතුමනි, මේ ධූර කාලය තුළ අපි හමුවන අවසාන දිනය අද වෙන්න පුළුවන්. ඒ වුනත් ජනතාවට අසාධාරණයක් වෙන්න දෙන් නැහැ. ඒ නිසා මම මෙයට විරුද්ධ වෙනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය - (එ.ජා.ප.)</u>**

සියලුදෙනාගෙන්ම අවසරයි. මම මේ ගිවිසුම අනුමත කරනවාද නැද්ද යන්න ඉදිරිපත් කරන්න නෙවෙයි ඇත්තටම නැගී සිටියේ. මගේ හිතට නැඟුණු පුංචි අදහසක් ඉදිරිපත් කරන්නයි මට අවශ්‍යය. ඒක අපි සියලුදෙනාටම වැදගත්වෙයි කියලා හිතනවා ඉදිරි අනාගතයේදී. ඇත්තටම අපේ

රටේ මහනගර සභා, නගර සභා , ප්‍රාදේශීය සභා වශයෙන් 341 ක් තියෙනවා. මේවා වර්ග කරලා ගොඩවල් 3කට බෙදලා තියෙන්නේ විවිධ අවශ්‍යතා ඇති නිසා. කොළඹ මහ නගර සභාවට සංවර්ධන ව්‍යාපෘති ඉදිරිපත් කිරීමේදී ඊට වඩා වෙනස් කුරුණෑගල නගර සභාවට සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කරද්දී. ඊටත් වඩා වෙනස් විය යුතුයි අපේ මේ පඬුවස්නුවර ප්‍රාදේශිය සභාව වැනි ප්‍රාදේශිය සභාවල සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරද්දී. ප්‍රාදේශිය සභාවක ඉන්න ජනතාවගේ සිතුම් පැතුම් වගේම අදහස්, අවශ්‍යතා මහනගර සභා, නගර සභාවල ඉන්න ජනතාවට වඩා වෙනස් කියලා අත්දැකීමෙන් මමත් දන්නවා. මම අවුරුදු 20ක පමණ ඉතිහාසයක් දන්නවා මේ පඬුවස්නුවර ගැන.මම ආව කාලේ සිටම මේ ක්‍රීඩා පිටිය බොහෝ ග්‍රාමීය වැඩසටහන් වලට වෙන් කර ගත්තා. දන්සැල්, විනෝද මේලා, ක්‍රීඩා වැඩසටහන්, සංගීත වැඩසටහන් ආදී දේට උපයෝගී කර ගත්තා. ප්‍රාදේශීය මට්ටමේ විවිධ අවශ්‍යතා සඳහා මේ ක්‍රීඩා පිටිය අපි භාවිතා කළා. එවකට ක්‍රීඩා ඇමතිව සිටි දයාසිරි ජයසේකර මැතිතුමා පඬුවස්නුවර ප්‍රදේශයේ ජනතාව ගැන හිතලා තමා මෙතරම් මුදල් සම්භාරයක් යොදවලා මේ ක්‍රීඩා පිටියේ සංවර්ධන කටයුතු කළේ. ඇත්තටම මෙතරම් මුදල් ප්‍රමාණයක් අත්‍යවශ්‍යම ස්ථානයකට යෙදුවා නම් හොඳයි කියලායි මගේ අදහස. ඇත්තටම අපි රටක් විදියට ණය බරින් හිරවෙලා ඉන්න මේ අවස්ථාවේ අනවශ්‍ය ස්ථානවලට අනවශ්‍ය පරිදි සංවර්ධන කටයුතු සඳහා මුදල් යෙදවීම අනවශ්‍ය දෙයක් විදියට මම හිතනවා. උදාහරණ විදියට ගත්තොත් හම්බන්තොට සංවර්ධන ව්‍යාපෘති පෙන්වා දෙන්න පුළුවන්. ඒවාට අනවශ්‍ය පරිදි මුදල් යෙදවීම නිසා තමා අපි ණය කරුවෝ බවට පත් වුණේ. ඒ වගේ තමා ක්‍රීඩා ඇමතිතුමා එදා මීට වඩා අත්‍යවශ්‍ය දේකට මුදල් යෙදෙව්වානම් හොඳ වෙන්න තිබුණා. මම දෝෂාරෝපණය කරනවා නෙවෙයි. ඇත්තටම මෙතනත් ඉන්නවා දක්ෂ දේශපාලකයෝ ඉතින් ඒ අයට මේවා හොඳ අත්දැකීම් තීන්දු තීරණ ගනිද්දී. ඉතින් තීන්දු තීරණ ගනිද්දි ඉතා ඥානාන්විත වෙන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**</u>

ගරු මන්ත්‍රී තුමන්ලා ඉදිරියේදී අදහස් ප්‍රකාශ කරද්දී මේ මාතෘකාවට අදාළ දේවල් පමණක් ප්‍රකාශ කරන්න.

<u>**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා - (එ.ජා.ප.)**</u>

සියලුදෙනාගෙන්ම අවසරයි. මේ සම්බන්ධව ගිය මාසේ අපි කතා කළා. විශේෂයෙන්ම කිව යුතුයි, මමත් මේ වෙනවිට අවු.10ක් මෙම සභාව නියෝජනය කරලා තියෙනවා. හැබැයි, මෙහෙම ක්‍රීඩා පිටියක් තිබෙනවාද කියලාවත් අඩුපාඩු ගැන මේ වනතුරු කිසිම මන්ත්‍රීවරයෙක් කතා කළේ නෑ. ඒක තමා ඇත්ත කතාව. ගිය මාසේ කමිටුවක් දැම්මා. කමිටු සාමාජිකයෝ පත් කළා. ජ.වි.පෙ. මන්ත්‍රීතුමාත් කමිටුවට පත් කළා. එතුමා කීවා දින 05කට කළින් දැනුම් දෙන්න කියලා. ඔබතුමා කැත කතාවක් කියනවා. අපි වීදි ලාම්පුවක් ඉල්ලුවත්, මෝටර් ග්‍රේඩරේ ඉල්ලුවත් අපි මොනවා කළත් හැමදාම එතුමා සාක්කුව ගැන තමා කතා කරන්නේ. අපි අනුන්ගෙන් තේ එකක්වත් බොන් නෑ. අපි එහෙම නෑ. මේ ගැන මෙතෙක් කතා කළ මන්ත්‍රීවරු විසඳුමක් කිව්වේ නෑ. හැබැයි බෙදීමක් ඉල්ලනවා. ඡන්දය දෙනවාද? නැද්ද? ස්වාධීන වෙනවාද? යන කතාව අදාළ නෑ. අපි ඡන්දය දෙනවා. හැබැයි මේකට විසඳුම කියන්න. මේක බදු දෙනවාද ගිවිසුමකට යනවාද කියන එක ගැන පැහැදිලි විසඳුමක් කියන්න. ඒක තමා මගේ අදහස.

<u>**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.ආර්.එම්.අපර්ණ නිලුපුල් සේනාරත්න මහතා - (එ.ජ.නි.ස.)**</u>

ගරු සභාපතිතුමනි, බෙදීමක් නෙවෙයි, අපි තව කමිටුවක් තියෙනවා. ඉතින් ගිවිසුමට එන්න තව කරුණු තියෙනවානම් ඒවා ඇතුළත් කරන්න කතා කරමු, මේක බෙදීමකට යනවාට වැඩිය. මොකද මොකක් හරි විසඳුමක්නේ මන්ත්‍රීවරුන්ට දෙන්න අවශ්‍යය. තව කරුණු ඇතුළත් වෙන්න තියෙනවාද? මොකක් හරි විසඳුමක් දෙන්න.

<u>**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ජයන්ත හේරත් මහතා - (පො.ජ.පෙ.)**</u>

අපි විසඳුමකුත් දෙන්නම්. නමුත් බෙදීමකට යායුතුමයි.

<u>**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඩී.මනෝ කුමාර එදිරිසිංහ මහතා - (එ.ජා.ප.)**</u>

ගරු සභාපතිතුමනි, ජ.වි.පෙ. මන්ත්‍රීතුමා ඉස්සරවෙලාම කීවේ මෙයින් කොමිස් ගන්න කතාවක්. හැබැයි මම දැකලා නෑ ලංකා ඉතිහාසයේ කිසිම දවසක ජනතා විමුක්ති පෙරමුණ කිසිම හොඳ වැඩකට සහාය දීලා තියෙනවා. හැමදේටම විරුද්ධ වීම තමා කළේ. මේ සභාවේ ඉන්න මන්ත්‍රීවරුන්ට හොඳට මතක ඇති. ඔවුන් වැඩක් කරන්නේත් නෑ. සභාවෙන් දෙන වීදි ලාම්පුවක්වත් අරන් ගමට වැඩක් කරන්න මුලින්.මේ ක්‍රීඩාංගණය තුළින් ජාත්‍යන්තර තලයේ ක්‍රීඩකයෝ බිහිවෙන්න පුළුවන්. දයාසිරි ජයසේකර මැතිතුමා ක්‍රීඩාංගණය හදපු එක ගැන සතුටු වෙනවා මම. මගේ පුතත් ක්‍රීඩා කරනවා. තව කිව්වා රු.500.00ක් අය කරනවා කියලා පුහුණු කරන්න. නැටුම් පංතියකට දරුවෙක් දැම්මත් ඒ ගුරුවරු ගාස්තුවක් අය කරනවා. ඉතින් ක්‍රීඩා අමාත්‍යාංශයෙන් ඔහුට

පඩි ගෙවන් නැත්නම් ඔහු ක්‍රීඩාවට දක්ෂයෙක් නම් ගාස්තුවක් දුන්නාට කමක් නෑ. ඉතින් අපි මේක අවුරුද්දකටනේ දෙන්නේ. අපි බලනවා අවුරුද්දක් තුළ මොකද කරන්නේ කියලා . ඒකයි අපි කියන්නේ. අපි මේ ලකුණු ගන්න නෙවෙයි හදන්නේ. මොකක් හරි ප්‍රශ්නයක් තියෙනවානම්, මම ජනතාව සමඟ ඉන්න මිනිහෙක්. මේ ප්‍රාදේශීය සභා විසුරුවොත් මොකද වෙන්නේ, දයාසිරි ජයසේකර මහතා දාපු ආණ්ඩුකාරයෝ මේක (ok) පිළිගන්වා. එතකොට දාපු එක කොන්දේසියක්වත් පිළිගන් නෑ. එතකොට ගමේ අයට ක්‍රීඩා කරන්නත් නෑ, රටේ අයට ක්‍රීඩා කරන්නත් නෑ පැහැදිලි කතාව ඒකයි. මේක විසිරුවොත් මේ කොන්දේසි ඔක්කෝම ඉවරයි. අපිට වටිනා දෙයක් මේ ක්‍රීඩා පිටිය.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී.රංජිත් ප්‍රේමලාල් මහතා - (එ.ජ.නි.ස.)</u>**

සියලු දෙනාගෙන්ම අවසරයි.සුබ නව වසරක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා.ගරු සභාපතිතුමනි, මම හිතන්නේ මේක දිගටම කතා කළ යුතු කාරණයක් නෙවෙයි. පසුගිය මහා සභා වාරයේ දී තමයි මේ ගැන යෝජනා කළේ. ඒ අවස්ථාවේ සියලුදෙනාගේ අදහස් විමසලා කමිටුවක් පත් කළා. කමිටුවට බලය දුන්නා කමිටුවේ නිර්දේශ ඉදිරිපත් කරන්න. ඒ පිළිබඳව මහා සභාව දැනුවත් කරන්න කටයුතු කළා. අපි සියලුදෙනාම කටයුතු කරන්නේ ජනතාවගේ සුබ සිද්ධිය වෙනුවෙන්. අපි ජනතාවගේ පැත්තෙන් හිතලා තමයි මේ කොන්දේසි ඉදිරිපත් කරලා තියෙන්නේ. මෙයින් හෙට්ටිපොල ජනතාවට විතරක් නෙවෙයි,පඩුවස්නුවර ආසනේම අයට ක්‍රීඩා කරන්න තිබෙන ක්‍රීඩාංගනයක්. ඉතින් අපි හැමෝටම වගකීම තියෙනවා. කමිටුවේදී සියලු කාරණා සලකා නිර්දේශ ඉදිරිපත් කළා.පසුගිය කාලේ හැමදාම ක්‍රීඩා කරන්න ආව අයගෙන් ක්‍රීඩාංගනය පිරිලා. ඉතින් මේකේ හැමකෙනෙකුටම ක්‍රීඩා කරන්න පුළුවන්. අපි සියලුදෙනාම ජනතාවගේ පැත්තෙන් හිතලා සභාවට ආදායම් ලැබෙන විදියට වැඩ කරමු. මෙයින් බලාපොරොත්තු වෙන්නේ විශේෂයෙන්ම ප්‍රදේශයේ ඉන්න දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ඉඩක් හදලා දෙන්න. ක්‍රිකට් ක්‍රීඩාවේ ලෙදර් පන්දු ක්‍රීඩා කරන්න අපිට ශක්තිය මදි කියන දේ මම පිළි ගන්නේ නෑ. ක්‍රිකට් පාලක මණ්ඩලයට ක්‍රිකට් සංගමයට දුන්නාට පස්සේ විශාල මුදලක් එනවා. මේ මුදල එන්නේ ක්‍රීඩා කරන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සුබ සිද්ධිය සඳහා. ක්‍රිකට් සංගමය මේ නිසා විශාල පිටිවහලක් වෙනවා. පුහුණුකරුට ගෙවීමක් කරන එක අද ඊයෙක වුණ දෙයක් නෙවෙයි. ක්‍රිකට් පාලක මණ්ඩලය හරි, රජය හරි, සභාව හරි මේ පුහුණුකරුවන්ට මුදල් ගෙවන් නැත්නම්, මගේ දරුවාත් ක්‍රිකට් ගහනවා මෙහේ.ඉතින් මමත් පුහුණුකරුට ගෙවනවා. එක එක්කෙනාගේ ඔළුවලට විෂබීජ දාලා එහෙම කතා කරන්න එපා. හැමදාම කලේ විරුද්ධ වෙන එක. විරුද්ධ වෙනවානම් කියන්නකෝ මේකට විසඳුමක්. මම හිතන්නේ මේක කාලෝචිත යෝජනාවක්. මෙයට බෙදීමක් ඉල්ලීම නෙවෙයි කළ යුත්තේ. මෙයට සහාය දීලා ජනතාව වෙනුවෙන් කටයුතු කරමු. මම කියන්නේ මේක සුබවාදීව බලන්න. මෙය සංවර්ධනය කරලා මේ ක්‍රීඩාංගනයෙන් ජාතික තලයේ ක්‍රීඩකයෝ බිහි කළයුතුයි. අපි මේ ක්‍රිකට් පාලක මණ්ඩලය හරහා ඉදි කළ ක්‍රීඩාංගනය අපේ අහිංසක දරුවෝ වෙනුවෙන් ඔවුන්ගේ දක්ෂතා එළිදක්වන්න අවකාශ සලසා දීම පළමු කාරණාව. ඒක සභාවට බරක් නොවී මේ මහ ජනතාවගේ බදු මුදල්වලින් නඩත්තු කරන්න ලොකු දේවල් සභාවට දාගන් නැතුව අරමුදලක් හරහා සංවර්ධනය කරන්න ඒ හරහා අපටත් යම්කිසි වැඩක් සිදුවෙයි.ඒක දෙවැනි කාරණාව. අනික උදේට හැන්දෑවට අපේ ගම්වල ඉන්න සැහැල්ලු පන්දු හා අනිත් ක්‍රීඩාවන් කරන තරුණ තරුණියන්ටත් අවස්ථාව දෙන්න පුළුවන් නම් අපේ විශාල ජයග්‍රහණයක්. බොහෝම ස්තුතියි.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා - (එ.ජ.නි.ස.)</u>**

සියලුෙදනාටම සුබ නව වසරක් ප්‍රාර්ථනා කරනවා. හෙට්ටිපොල මහජන ක්‍රීඩාංගනය පිළිබඳව සාකච්ඡා කරද්දී ගරු සභාපතිතුමනි, අපි ගිය සභා වාරයේදී මේ සම්බන්ධව තීරණයක් ගන්න, කොන්දේසි පනවන්න කමිටුවක් පත් කළා. ඉතින් බදු දෙන්න නෙවෙයි බදු කොන්දේසි පනවන්න තමා කමිටුව පත් කරන්නේ. නමුත් ගරු මන්ත්‍රීවරුන්ගේ කතා අහගෙන ඉන්න විට මට හිතෙන්නේ මේ කරුණ වෙනත් පැත්තකට තමා ගමන් කරන්නේ කියලා. අපි දේශපාලන පක්ෂ නියෝජනය කරන මන්ත්‍රීවරු වශයෙන් එය ගැලපෙන්නෑ.මේ විෂය භාරව සිටියේ අපි නියෝජනය කරන පක්ෂ නායකතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මහ ලේකම්තුමා ක්‍රීඩා අමාත්‍යවරයා වශයෙන් වැඩ කටයුතු කළ කාලේ. එතුමාත් තනි හිතුමතේට මේ විෂය පඩුවස්නුවරට ගෙනාවේ නෑ. එතුමාගේ කාර්යයභාරය තමා ක්‍රීඩා විෂය තුළ අදාළ කරුණු ටික කිරීම. එතුමාගේ මැතිවරණ දිස්ත්‍රික්කය කුරුණෑගල. එතුමාගේ ආසනය පඩුවස්නුවර. අපේ බල ප්‍රදේශය තුළ විශාලම ක්‍රීඩා පිටිය තමා මේ හෙට්ටිපොල මහජන ක්‍රීඩාංගනය. එතුමාගේ නමත් එක්ක කතා කරද්දී සමහරු හිතනවා මේ විෂය මෙහාට ගෙනාව එක වැරදියට.ලංකාවේ ඉදිවෙන්න තැන් තියෙද්දී කුරුණෑගල දිස්ත්‍රික්කයේ හෙට්ටිපොල මහජන ක්‍රීඩාංගනය සංවර්ධනය කරන්න මේ විෂය මෙහාට ගෙනාව එක වැරදිලු. මහජන

ඡන්දයෙන් පත්වුණ එතුමා කැබිනට් ඇමතිවරයෙක් වුණ එතුමා ජනතාව වෙනුවෙන් මේ කළ දේ හොඳ නෑ.එතකොට මිනිස්සු බොරුවට ඡන්දය දීලා තියෙන්නේ.එතුමාගේ යුතුකම තමා ජනතාවගේ ප්‍රශ්න විසඳන එක. මේ එතුමා ලබා දුන්න වටිනාකමක්. මේ එතුමාගේ ශක්තිය. එතුමා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට දාලා , ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට දාලා මේක අනුමත කරගත්තා.දැන් අපිට තියෙන්නේ නඩත්තු කරගැනීම හා මේක බදු දීමේදී ඇතිවෙන ප්‍රශ්න නිරාකරණය කර ගැනීම. මෙයට බෙදීමක් අවශ්‍යය නෑ මම හිතන්නේ. මේක දෙන්න කියන්නේ අවුරුද්දකට. මේ අවුරුද්ද තුළ මේ අය මොනවාද කරන්නේ කියලා බලමු. සභාව සතුව තමා අයිතිය තියෙන්නේ. එතනදී මේ අය යම් අසාරධාරණයක් කරනවානම් අපිට පුළුවන් අවුරුද්දකින් මෙය අහෝසි කරලා නැවත සභාවට ගන්න පුළුවන්. තව දුරටත් මේ ගැන විග්‍රහ කරනවානම් මෙතන බෙදිල්ලකට ගිහින් ඡන්දයකට යනවානම් එදා කමිටුව පත් කරලා ගත්තු තීන්දු තීරණ අපරාධයක්. ඒ නිසා මම හිතන්නෙ මේ අවුරුද්ද ගිවිසුම්ගත වෙලා අපි බලමු මොකද වෙන්නේ කියලා.පක්ෂ නායකවරු,විදුහල්පතිවරු, ක්‍රීඩාලෝලීන්,සභාපතිලා, ලේකම්වරු, ව්‍යාපාරිකයෝ අවශ්‍ය නම් ගෙනල්ලා මේ ගැන කතා කරලා අඩුවක් තියෙනවානම් ඒ අඩුව සම්පූර්ණ කරගෙන මේ විෂය සිදු කරමු. මෙය මොනවා කතා කළත් අවුරුද්දකින් අහෝසි කර ගන්න පුළුවන්.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.ආර්.එම්.අපර්ණ නිලුපුල් සේනාරත්න මහතා - (එ.ජ.නි.ස.)</u>**

ගරු සභාපතිතුමනී, මම යෝජනා කරනවා මෙය බෙදීමකට නොයා ගිවිසුමේ යම් යම් කරුණු සංශෝධනයට අවශ්‍ය නම් ඒ සම්බන්ධව කටයුතු කරගෙන යමු කියලා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා - (එ.ජ.නි.ස.)</u>**

ඒ යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

මේක දිගින් දිගටම කතා කරන එකේ තේරුමක් නෑ. මටත් තිබෙනවා යම් යම් කරුණු කතා කරන්න.නමුත් දැන් බෙදීමකට ගිහින් මේ යෝජනාව පරාජය කරනවාද? නැත්නම් මෙය දිගටම සාමකාමීව පවත්වාගෙන යනවාද?

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා - (එ.ජා.ප.)</u>**

සියලුදෙනාගෙන්ම අවසරයි, නිශාන්ත දේශප්‍රිය ගරු මන්ත්‍රීතුමා සඳහනක් කළා අවුරුද්දකට විතරක් මේක දෙමු කියලා. අපි පසුගිය කාලේ කළ කී දෑ වල ප්‍රතිඵල තාමත් අත්විඳිනවා. ඒ නිසා පරීක්ෂණ කර කරා අවුරුද්දක් දෙනවාට වඩා, කටයුතු කාරණා සාකච්ඡාවල ප්‍රතිඵල ඉදිරිපත් කර තිබෙන නිසා අපි තීන්දුවක් ගමු මේක දෙනවාද? නැද්ද? කියලා. ඒ වගේම මම දැන ගන්න කැමතියි, අපේ මේ ක්‍රීඩා පිටිය අපේ මේ සභාවට දීලා තියෙන්නේ තාවකාලිකවද? අධ්‍යාපන අමාත්‍යාංශය සතුයිද? අපේ සභාව සතුයිද? කියලා.මොකද මට මේ හැමදෙනාගේම කතාවලින් ඇහුණේ තාවකාලික කියන කතාවක්. අපිත් හෙට්ටිපොල පාසලේ දරුවෝ විදියට මේ ක්‍රීඩාංගනේ ක්‍රීඩා කරලා තියෙනවා. නමුත් පසුගිය කාලේ මේ ක්‍රීඩා පිටිය ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ තිබෙන බවක් තමා නිමල් දයානන්ද ගරු මන්ත්‍රීතුමා සභා වාරයකදී කියනවා මං අහගෙන හිටියා. ඉතින් ඒ නිසා මම තවත් දැන ගත යුතු කාරණයක් තමා ජයන්ත හේරත් ගරු මන්ත්‍රීතුමා ඍජුවම මෙයට බෙදීමක් ඉල්ලලා හරිම නිෂ්ශබ්දව ඉන්නවා. මේකට තව පාර්ශවයක් කරුණු කාරණා කියමින් මෙය දෙන්න අවශ්‍යයි කියන මට්ටමේ ඉන්නවා. ඉතින් මේකේ ඇතුළේ නැති තව මොකක් හරි එකක් තියෙනවා වගේ කියලා හිතෙනවා. ඒ නිසා මේ කාරණා සියල්ලම සැලකිල්ලට අරගෙන අපි සියලුදෙනා යම්කිසි ඒකමතික තීන්දුවකට එමු කියලා මම යෝජනා කරනවා.

**<u>ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා</u>**

සියලුදෙනාගෙන්ම අවසරයි.මේ හෙට්ටිපොල ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීමෙන් පසු බදු පදනම මත ලබාදීම සම්බන්ධයෙන් අපි පසුගිය සභාවෙත් දීර්ඝ ලෙස සාකච්ඡා කළා. ඒ වගේම අද දවසේත් වැඩි කාලයක් වෙන් කළේ මේ විෂය සම්බන්ධවයි. විශේෂයෙන්ම මම මතක් කරන්න අවශ්‍යයි මේ ප්‍රශ්නයට තුඩුදීලා තියෙන්නේ ක්‍රීඩා පිටියේ සංවර්ධන කටයුතු. සංවර්ධනය නොකළා නම් අපිට මේ බදු දීමක් කරා අපිට යන්න වෙන් නෑ. පසුගිය සභාවේ ධූර කාලය 2015.05.15 වෙනිදායින් අවසන් වුණා. නැවත සභාවට ආවේ 2018 මාර්තු මාසේ. අවුරුදු 2 ½ක කාලයක් අපි හිටියේ නෑ. එතකොට මේ ක්‍රීඩා පිටියේ සංවර්ධන කටයුතු සඳහා යොදවලා තිබුණේ මහජන නියෝජිත අපි මේ සභාවේ නොසිටි කාලේ. මම ගරු සභාවට මතක් කරන්නේ මාර්තු වන විට මේ සභාවට අලුතින් ගරු සභාවක් පත්විය යුතුයි. සමහරවිට ඡන්දය තියයි ද? නොතියයි ද? කියලා අපිට කියන්න බෑ. නමුත් සමහර විට 2015 වාගේ ඡන්දය නොතියා ඉස්සරහට යන්නත් පුළුවන්. ඒ නිසා මම ගරු සභාවට මතක් කරන්නේ ඉදිරියේදී සභාවේ අපේ නියෝජනයක් නැතිවෙන්නත් පුළුවන්. මේ සාදා ගත්තු කොන්දේසියක්. අපි සියලුදෙනා එකතුවෙලා තමා මෙය සකස් කළේ. ඒ වෙලාවේ අපිට අමතක වු

කාරණා තියෙන්න පුළුවන් පසුව මතක් වුණ. එහෙම අමතක වුණ අඩුපාඩු තැන් ජයන්ත ගරු මන්ත්‍රීතුමා අද සභාවට ඉදිරිපත් කළා. එතුමාගේ කරුණු තුළ වැදගත් වටිනා කරුණු තියෙනවා. ක්‍රීඩා පිටියේ අයිතිය සම්බන්ධ දේවල් තියෙනවා එතුමා ඒ ගැන මතක් කළා. ඒ නිසා මම කියන්නේ මේ අඩුපාඩු අපි හදාගෙන නැවත ගිවිසුම්ගත වෙලා යනවාද? එහෙම නැත්නම් අපි නොසිටි කාලෙක සමහරවිට මේ පළාත් පාලන ආයතනය කොමසාරිස්වරයෙකුගේ පාලනයට ඉදිරියේදී යොමු කළාට පස්සේ අවු.10ක්12ක් වගේ දීර්ඝ කාලයකට යයිද දන් නෑ. ඒක මට කියන්න බෑ. ජයන්ත හේරත් ගරු මන්ත්‍රීතුමා හා ජ.වි.පෙරමුණේ ගරු මන්ත්‍රීතුමාත් මෙයට දැඩි ලෙස විරුද්ධ වුණා. ජයන්ත හේරත් ගරු මන්ත්‍රීතුමාගේ විරුද්ධත්වය සලකා බැලිය යුතුයි, නමුත් ජ.වි.පෙ. ගරු මන්ත්‍රීතුමාගේ විරුද්ධත්වය සැලකිය යුතු නෑ. මොකද හේතුව මොන හොඳ වැඩක් කළත් එතුමාලා කළේ විරුද්ධ වීම තමා.සමාජය ගත්තත් කියන්නේ බාල්දිකාරයෝ කියලානේ. ඔවුන් කිසි වැඩක් ගමට කරන්නෙත් නෑ.වීදි ලාම්පුවක් දාන්නෙත් නෑ. මෝටර් ග්‍රේඩරය ගෙනල්ලා පාරක් හදන්නෙත් නෑ. මිනිසුන්ගේ ඔළු නරක් කරන එක තමා කරන්නේ. සමාජය නොමඟ යවනවා. අවු.18-25 අතර කාල සීමාවල දරුවෝ සමාජ විරෝධී වැඩවලට පොළඹනවා. මිනිසුන්ගේ ඔළු විකෘති කරනවා. ඊර්ෂියාව, කුහකකම, භේද ඇති කරලා සමාජයම විනාශ කරලා තියෙන්නේ. මේ අය අමුතු සිතුම් පැතුම් තියෙන අමුතුම මිනිස් කොට්ඨාශයක්. සත්තු වගේ ජාතියක්. ඒ නිසා ඔබතුමන්ලා රටට වැඩදායි වෙන්න. කමිටුවට දාලා තියෙද්දීත් ඔබතුමා ආවේ නෑ. දැන් විරුද්ධව කතා කරනවා. ජයන්ත ගරු මන්ත්‍රීතුමා අපි සාකච්ඡා කරමු. අපි බෙදීමකට නොගොස් ඔබතුමාලා සතුටුවෙන පරිදි වෙනස්කම් අඩුපාඩු සකසමු. එහෙම නැත්නම් බෙදීමකට යනවානම් කණ්ඩායමක් විදියට අපි සාකච්ඡා කරලා තමයි බෙදීමකට එන්නේ. ඒ නිසා මම කියන්නේ බෙදීමකට නොගොස් සාකච්ඡා කරලා මේ කොන්දේසි අලුත් කරලා හෝ සම්මුතියකට එමු.

<u>**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා - (එ.ජා.ප.)**</u>

ගරු සභාපතිතුමනි, මම මේකට කතා නොකරන්න හිතාගෙන හිටියේ. නමුත් මම හෙට්ටිපොල කොට්ඨාශේ මන්ත්‍රීවරයා, හෙට්ටිපොල පාසලේ ආදි ශිෂ්‍යයෙක්. මේ යෝජනාව ඔබතුමා ඉදිරිපත් කළ වෙලාවේ මේ ගැන සද්භාවයෙන් තමයි කතා කළේ. අපර්ණ මන්ත්‍රීතුමා කීවා වෙලගෙදර ක්‍රීඩාංගනය පවරද්දී මේ ගිවිසුම් හදද්දී ඇතිවුණ අඩුපාඩු ඇති.අඩුපාඩු තිබුණ නිසා තමයි ඒ අයට ගැටළුවක් ඇතිවෙලා ඇත්තේ.මම බෙදීමකට යන්න ලෑහැස්තිත් නෑ. දැන් පිළිවෙළකට තියෙනවා.මේක තුළ සංගීත සංදර්ශන පවත්වන්න දෙන්න බෑ. මම දන් නෑ ඔබතුමාලා කොහොම හිතනවාද කියලා .මට මෙය ක්‍රිකට් බෝර්ඩ් එකට දුන්නා කියලාවත් මට කීයක්වත් ලැබෙන්නේ නෑ.හැබැයි මම එකක් දන්නවා. මෙය විසිරෙව්වොත් ඔය කියන ගිවිසුම් මොනවත් නැතුව දයාසිරි ඇමතිතුමා පත් කරපු ආණ්ඩුකාරවරයා පාලනයට ගන්නවා. මෙහි රීති ප්‍රශ්නයක් තියෙනවා, ඡන්දයකට යන්න බෑ.මම මේ ගැන කතා නොකලේ ඡන්දයකට යනවාද නැද්ද මේක නවත්වනවාද මට ප්‍රශ්නයක් නෑ. මම ඡන්දයකට ලෑහැස්ති නෑ. මේක දිනුවත් පැරදුනත් මට වැඩක් නෑ. මම හෙට්ටිපොල පාසලේ ආදි සිසුවෙක්. ඒ වගේම මේ නගරය විනාශ වෙනවාට මම කැමති නෑ. අපි කතා කළා පාපන්දු සෙල්ලම් කරන ළමයින්ට ක්‍රිකට් සෙල්ලම් කරන තරඟ තීරය හැර ඉතිරි හරිය දෙන්න. ඔවුනුත් ඒකට කැමති වුණා. අපේ ගිවිසුමට පිටින් යන දේවල් සිදුවෙනවානම් මෙය අහෝසි කරන්න පුළුවන්.

<u>**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**</u>

දැන් දීර්ඝ වෙලාවක සිට මේ මහජන ක්‍රීඩාංගනය ගැන තමා සාකච්ඡා කරන්නේ. ඡන්දයකට යමු කියලා කියනවා. ඒ වගේම මේ ක්‍රීඩාංගනය සම්බන්ධව ඒක පාර්ශවික තීන්දුවක් අපි අරගෙන නෑ. ඒ වගේම යටි දේශපාලන අරමුණු තිබුණෙත් නෑ. බොහෝම සද්භාවයෙන් කරපු වැඩක්. කුරුණෑගල දිස්ත්‍රික්කයේ තියෙන ක්‍රීඩාංගන අතරින් එක විශාල ක්‍රීඩාංගනයක් මේක. දයාසිරි ජයසේකර මහතා නොසිටියා නම් මේ ක්‍රීඩාංගනය අපිට නොලැබෙන්නත් තිබුණා. මම එතුමාගේ පක්ෂයේ නෙවෙයි. අපි සියලු දේශපාලන පක්ෂ නියෝජනය කරලා කමිටුවක් පත් කරලා තමයි මෙම තීරණ ගත්තේ. නමුත් එදා සමහර තීරණ අමතක වෙන්න ඇති මෙයට ඇතුළත් කරන්න. ඡන්දයකට යාමට රීති ප්‍රශ්නයක් තියෙනවා. නමුත් ඔබතුමාලාට පුළුවන් මේ කමිටු තීරණ පිළිගන්නවාද නැද්ද තීරණය කරන්න. මෙය පඬුවස්නුවර ජනතාවට සම්පතක්. වැදගත් කාරණා නැවත අපි මේ කොන්දේසිවලට ඇතුළත් කරමු. ආර්.එම්.කේ.බී.රත්නායක නම මේ ක්‍රීඩාංගනයට දාන්න යෝජනා කරනකොට අපි ස්ථිර කළා. මේ ක්‍රීඩාංගනය හදන අවස්ථාවේ මේ බෝර්ඩ් එක ගලවා දැමුවා. නැවත අපි තීන්දුවක් ගත්තා ආර්.එම්.කේ.බී.රත්නායක ක්‍රීඩාංගනය නමින් මේ ක්‍රීඩාංගනය නම් කරන්න. ජයන්ත හේරත් මන්ත්‍රීතුමා බෙදීමකට යන්න හේතුවක් වුණා අනෙක් ක්‍රීඩාවන්හි යෙදෙන ක්‍රීඩකයින්ට ලබාදෙන කාල සීමාව ගැන. ඒ ගැන ඔබතුමා මෙයට ඇතුළත් කරන්න. කමිටුව තීන්දු කරලා මේ මේ කාල

සීමාවන්හි මේ ප්‍රදේශයේ අයට ක්‍රීඩා කරන්න දෙන්න පුළුවන්. ඊළඟට කබඩි ක්‍රීඩාවට ඉදි කිරීම් සඳහා කොන්දේසි ඇතුළත් කර ඇත. ඒ අයට ඉදි කිරීම් කරන්න බෑ. මේ ක්‍රිකට් සංගමය යම් ඉදි කිරීමක් කරනවා නම් ඒ ගැන පූර්ණ අධීක්ෂණයක් අපි කරනවා. අපේ කොන්දේසි යටතේ තමයි ඒ අය ඉදිකිරීම් කළ යුත්තේ. ඒවා ගලවන් යනවාද නැද්ද තීරණය කරන්නේ සභාව. පූර්ණ බලතල තියෙන්නේ සභාවට. අපේ කොන්දේසිවලට ඒ අය එකඟ වෙනවා මිසක් ඒ අයගේ කොන්දේසිවලට අපි එකඟ වෙනවා නෙවෙයි. ඊළඟට ඉඩමේ අයිතිය ගැන කතා කළා. මේක වසර 30කට වැඩි කාලයක් පරිහරණය කරපු භූමියක්.මේ අවුරුදු ගානට ඔය පාසල්වල කිසිම කෙනෙක් මේක ඉල්ලලා නෑ. ඒ නිසා අපිට ලැබුණ සම්පතක් විදියට අපි මේක පවත්වාගෙන යනවා. මෙහි පරම අයිතිය පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට තියාගෙන තමා මේ සියලු කොන්දේසි දැම්මේ. සංගීත සංදර්ශන පැවත්වීමට මේ ක්‍රීඩාංගනය අවශ්‍ය නෑ. ගෙවුණ වසරේ මොන නැති බැරිකම් තිබුණත් මේ ප්‍රදේශයේ මිනිස්සු සංගීත සංදර්ශන පැවැත්තුවා. ලක්ෂ 8ක ආදායමක් ලැබිලා තියෙනවා සංගීත සංදර්ශනවලින්. නමුත් මේ පොදු ක්‍රීඩාංගනය තුළ කවුරුත් සංගීත සංදර්ශන පැවැත්තුවේ නෑ. ඉතින් අවට ඇති තරම් ස්ථාන තියෙනවා සංගීත සංදර්ශන පවත්වන්න. සති පොල භූමියේ DJ ප්‍රසංගයක් පැවැත්තුවා. නමුත් මම අදටත් විරුද්ධයි ඒකට.ඉතින් සංගීත සංදර්ශන පවත්වන්න මේ ක්‍රීඩාංගනය අවශ්‍ය නෑ. මේ ක්‍රීඩාංගනය නඩත්තුවට දාලා තියෙනවා බහු කාර්ය සහායකයින් 10 දෙනෙක්. එක් අයෙකුට ගෙවනවා රු.22000.00ක මුදලක්. මේ දහදෙනාට මාසෙකට යනවා දෙලක්ෂ විසිදෙදාහක්. ඒ වගේම සභාවෙන් 3ක් දාලා තියෙනවා. ඒ අයට මාසෙකට එක් ලක්ෂ විසි දාහක් යනවා. අනෙක් නඩත්තු සඳහා රු.40000.00 ක් පමණ වෙනවා. අපිට ලක්ෂ හතරක පමණ වියදමක් මේ සභාවෙන් යනවා. ඉතින් ක්‍රිකට් සමාජයට දුන්නාම රු.60000.00ක පමණ ආදායමක් ලැබෙනවා. ඉතින් මේ රු.60000.00 අපි ගන්නේ කිසිම වියදමක් නැතුවනේ. පසුගිය කාලේ ක්‍රිකට් ගහලා අපිට ලැබුණේ රු.10000.00ක් වගේ මුදලක්නේ. ඉතින් ඇයි මෙහෙම කරන්නේ. ඒ නිසා අපි බොහොම බුද්ධිමත්ව තීරණ ගන්න අවශ්‍යයි. මෙයින් අපට අසාධාරණයක් වෙන්නේ නෑ.අපි යහපතක් කරන්න හදන්නේ. මම කියන්නේ මෙයට බෙදීමක් අවශ්‍ය නෑ. ජනතාව වෙනුවෙන් අපි නිවැරදි තීන්දුවක් ගත යුතුයි. මෙය අතහැර දැම්මොත් මේ ක්‍රීඩාංගනය නඩත්තු කරන්න කවුරුත් නෑ. ඒ නිසා මේ ගැන හොඳට හිතලා බලන්න. අපි මෙය පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතියට යොමු කරලායි ඉදිරි වැඩ කරන්නේ.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ජයන්ත හේරත් මහතා - (පො.ජ.පෙ.)</u>**

ගරු සභාපතිතුමා, මම කුරුණෑගල ක්‍රිකට් සමාජයට මේ ක්‍රීඩාංගනය බදු දෙනවාට විරුද්ධයි.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

ඒ ඔබතුමාගේ ස්වාධීන අයිතිය. නමුත් ඔබතුමා මහජනතාවට වැරදි අර්ථකථන දෙන්න එපා. පාසල ගැන හිතලා, අවට ක්‍රීඩකයින් ගැන හිතලා, සභාව ගැන හිතලා මේ වටිනා දේපලක් ආරක්ෂා කර ගන්න මේ තීන්දු දීලා තියෙන්නේ. අපේ කොන්දේසි කඩ කළොත් මේ ක්‍රීඩාංගනය නැවත අපේ අයිතියට ගන්න පුළුවන් විදියටයි අපි මේ කොන්දේසි හදන්නේ.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා - (එ.ජා.ප.)</u>**

ගරු සභාපතිතුමා, කමිටුව නියෝජනය කළ නිසා ඒ කමිටුවට විරුද්ධ වුණොත් මොකද වෙන්නේ.මුදල් කමිටුවේ නම් අපි තීරණයක් ගන්නවානේ. තීරණයක් ගත්තාම ඒ තීරණයට විරුද්ධව අපි ඡන්දය දෙනවා. නමුත් යම් කිසි කාලෙකදි ප්‍රශ්නයක් ආවොත් අධිභාරයක් වගේ එන්න පුළුවන් නේද?එතකොට අපිට මොකද වෙන්නේ?

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා අපි මේ ගැන තීන්දුවක් අරගෙන පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතියට යවනවා. එතුමා කියනවා නම් අනුමැතිය දෙන්න බෑ කියලා ඒ නියෝගය අපි පිළිගන්නවා. දැන් අපි බෙදීමකට යනවාද නැද්ද කියලා තීරණය කරන්නත් ඡන්දයක් තියන්න වෙනවා. නැත්නම් බෙදීමක් අවශ්‍යයි කීව යෝජනාව ඉල්ලා අස් කර ගන්න.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා - (පො.ජ.පෙ.)</u>**

ගරු සභාපතිතුමනි, අපි මීට වඩා සාකච්ඡා කරලා ගරු සභාවේ තීන්දු තීරණ ගත්ත අවස්ථා තිබුණා. මේ අපේ කාලේ අවසාන සභා වාරය වෙන්නත් පුළුවන්. මගේ අවසන් සභාව වෙන්නත් පුළුවන්. ඒ නිසා අපි තවත් නම්‍යශීලි වෙලා මේ කරුණ පැහැදිලි කරගෙන අපි බෙදීමකට යන් නැතුව ජනතා හිතවාදී සුබ තීරණයකට යමු කියන ඉල්ලීම මම කරනවා.මේ සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා මෙම මහා සභාව කාරක සභා අවස්ථාවක් බවට පත් කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

**ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා**
මම ඒ යෝජනාව ස්ථිර කරනවා.
**ගරු සභාපති බී.එම්. ධර්මසේන බමුණුසිංහ මහතා**
මෙම මහා සභාව කාරක සභා අවස්ථාවක් බවට පත් කරනවා.
**ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා**
මෙම කාරක සභා අවස්ථාව නැවත මහා සභාව බවට පත් කිරීම සුදුසු මා යෝජනා කරනවා.
**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඩී.මනෝ කුමාර එදිරිසිංහ මහතා - (එ.ජා.ප.)**
එම යෝජනාව මා ස්ථිර කරනවා.
**ගරු සභාපති බී.එම්. ධර්මසේන බමුණුසිංහ මහතා**
කාරක සභා අවස්ථාව නැවත මහා සභාව බවට පත් කරනවා.
**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ජයන්ත හේරත් මහතා - (පො.ජ.පෙ.)**
මම මෙය බදු දෙනවාට විරුද්ධයි.
**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා - (ජ.වි.පෙ.)**
මමත් විරුද්ධයි.
**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**
හෙට්ටිපොල මහජන ක්‍රීඩාංගනය ගිවිසුම් මත කුරුණෑගල ක්‍රිකට් සංගමය වෙත ලබා දීම සම්බන්ධව පත් කර ඇති කමිටුවට අදාල වාර්තාව සංශෝධන ඇත්නම් එය සංශෝධනය කර සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.
**ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා**
ගරු සභාපතිතුමනි,වර්ෂයක් සඳහා පමණක් ගිවිසුම් මත මාසික ගාස්තුවක් අය කිරිම යටතේ කුරුණෑගල ක්‍රිකට් සංගමය වෙත පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතියට යටත්ව හෙට්ටිපොල මහජන ක්‍රීඩාංගනය ලබාදීම සුදුසු බව යෝජනා කරනවා.තවද අදාල කමිටු වාර්තාවද පහත සඳහන් කරුණු ඇතුලත් කර සංශෝධනය කර පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

01.කබඩි ක්‍රීඩාව සඳහා ක්‍රීඩාපිටිය නොමිලේ ලබා දීම.

02.රගර් ක්‍රීඩාව සඳහා ක්‍රීඩාපිටිය නොමිලේ ලබා දීම.

03.ගිවිසුමේ වගන්ති දෙවන පාර්ශවය කඩකරන සෑම අවස්ථාවකම පළමු පාර්ශවය සඳහා ආපසු ලබා ගැනීමේ අයිතිය යටතේ සහ නීත්‍යානුකූලව කටයුතු කිරීමේ බලයට යටත්ව ,

04.මෙය ලබාදීමේ පදනම බදු පදනම නොව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ පැවරී ඇති බලය යටතේ කොන්දේසි සහිත ගිවිසුමකට එළඹ මාසික ගාස්තුවක් අය කිරීමේ පදනම මත ලබාදීම ලෙස සංශෝධනය වීම.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා - (එ.ජා.ප.)**
එම යෝජනාව මා ස්ථිර කරනවා.
**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**
වර්ෂයක් සඳහා පමණක් ගිවිසුම් මත මාසික ගාස්තුවක් අය කිරිම යටතේ කුරුණෑගල ක්‍රිකට් සංගමය වෙත පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතියට යටත්ව හෙට්ටිපොල මහජන ක්‍රීඩාංගනය ලබාදීම හා අදාල කමිටු වාර්තාව සංශෝධනය කර පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව වර්ෂයක් සඳහා පමණක් ගිවිසුම් මත මාසික ගාස්තුවක් අය කිරිම යටතේ කුරුණෑගල ක්‍රිකට් සංගමය වෙත පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතියට යටත්ව හෙට්ටිපොල මහජන ක්‍රීඩාංගනය ලබාදීම හා අදාල කමිටු වාර්තාව සංශෝධනය කර පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ සභා සම්මත විය.**

## V. පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් පල්ලේගම මීගහහේන ඉඩමේ තක්සේරු වටිනාකම පිළිබඳ වාර්තාව මහා සභාවට ඉදිරිපත් කිරීම.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් පල්ලේගම මීගහහේන ඉඩමේ වටිනාකම තක්සේරු කිරීම සඳහා පත් කළ තක්සේරු කමිටුවේ **වාර්තාව අනුව එහි** වටිනාකම රු.7,275,000.00 මුදල පිළිගැනීමත්, එය සභාවේ වත්කම් ලේඛනයට ඇතුළත් කිරීම සුදුසු බවට ගරු සභාවේ යෝජනා ස්ථිර කරන මෙන් ඉල්ලා සිටිනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා - (එ.ජ.නි.ස.)**

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් පල්ලේගම මීගහහේන ඉඩමේ වටිනාකම තක්සේරු කිරීම සඳහා පත් කළ තක්සේරු කමිටුවේ **වාර්තාව අනුව එහි** වටිනාකම රු.7,275,000.00 මුදල පිළිගැනීමත්, එය සභාවේ වත්කම් ලේඛනයට ඇතුළත් කිරීම සුදුසු බවත් මා යෝජනා කරනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය - (එ.ජා.ප.)**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් පල්ලේගම මීගහහේන ඉඩමේ වටිනාකම තක්සේරු කිරීම සඳහා පත් කළ තක්සේරු කමිටුවේ **වාර්තාව අනුව එහි** වටිනාකම රු.7,275,000.00 මුදල පිළිගැනීමත්, එය සභාවේ වත්කම් ලේඛනයට ඇතුළත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් පල්ලේගම මීගහහේන ඉඩමේ වටිනාකම තක්සේරු කිරීම සඳහා පත් කළ තක්සේරු කමිටුවේ වාර්තාව අනුව එහි වටිනාකම රු.7,275,000.00 මුදල පිළිගැනීමත්, එය සභාවේ වත්කම් ලේඛනයට ඇතුළත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## VI. 2022.12.21 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව මහා සභාවට ඉදිරිපත් කිරීම.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

2022.12.21 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා - (එ.ජා.ප.)**

2022.12.21 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා - (පො.ජ.පෙ.)**

2022.12.21 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

2022.12.21 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022.12.21 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## VII. 2022.12.21 දින පැවති ලංසු විවෘත කිරීමේ කමිටු වාර්තාව මහා සභාවට ඉදිරිපත් කිරීම.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

2022.12.21 දින පැවති ලංසු විවෘත කිරීමේ කමිටු වාර්තාව සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා - (එ.ජා.ප.)</u>

2022.12.21 දින පැවති ලංසු විවෘත කිරීමේ කමිටු වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා - (පො.ජ.පෙ.)</u>

2022.12.21 දින පැවති ලංසු විවෘත කිරීමේ කමිටු වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

2022.12.21 දින පැවති ලංසු විවෘත කිරීමේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022.12.21 දින පැවති ලංසු විවෘත කිරීමේ කමිටු වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## VIII. ප්‍රාදේශීය සභා ජල කුළුණ සහිත ටැංකිය හා ඉඩම මාසික කුලිය මත බදු ලබා දීම සඳහා තාවකාලික තක්සෙරුවක් ලබා ගැනීමේ වාර්තාව මහා සභාවට ඉදිරිපත් කිරීම.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

හෙට්ටිපොල ජල සම්පාදන ක්‍රමයට අයත් ජල ටැංකිය හා ගොඩනැගිල්ල පිහිටි ඉඩම ජාතික ජල සම්පාදන මණ්ඩලයට බදු දීම සඳහා ගාස්තු තක්සේරු කිරීම සම්බන්ධයෙන් විධිමත් තක්සේරුවක් ලබා ගන්නා තුරු පත් කළ තාවකාලික තක්සේරු කමිටුවේ වාර්තාව අනුව මාසිකව රු.25,000.00 මුදලක් අය කිරීම සුදුසු බව පිළිගැනීමත්, ඒ අනුව කොන්දේසි සහිත ගිවිසුමකට එළඹීමත් සුදුසු බව ගරු සභාවේ යෝජනා ස්ථිර කරන මෙන් ඉල්ලා සිටිනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා - (එ.ජා.ප.)</u>

හෙට්ටිපොල ජල සම්පාදන ක්‍රමයට අයත් ජල ටැංකිය හා ගොඩනැගිල්ල පිහිටි ඉඩම ජාතික ජල සම්පාදන මණ්ඩලයට බදු දීම සඳහා ගාස්තු තක්සේරු කිරීම සම්බන්ධයෙන් විධිමත් තක්සේරුවක් ලබා ගන්නා තුරු පත් කළ තාවකාලික තක්සේරු කමිටුවේ වාර්තාව අනුව මාසිකව රු.25,000.00 මුදලක් අය කිරීම සුදුසු බව පිළිගැනීමත්, ඒ අනුව කොන්දේසි සහිත ගිවිසුමකට එළඹීමත් සුදුසු බව මා යෝජනා කරනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා - (පො.ජ.පෙ.)</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

හෙට්ටිපොල ජල සම්පාදන ක්‍රමයට අයත් ජල ටැංකිය හා ගොඩනැගිල්ල පිහිටි ඉඩම ජාතික ජල සම්පාදන මණ්ඩලයට බදු දීම සඳහා ගාස්තු තක්සේරු කිරීම සම්බන්ධයෙන් විධිමත් තක්සේරුවක් ලබා ගන්නා තුරු පත් කළ තාවකාලික තක්සේරු කමිටුවේ වාර්තාව අනුව මාසිකව රු.25,000.00 මුදලක් අය කිරීම සුදුසු බව පිළිගැනීමත්, ඒ අනුව කොන්දේසි සහිත ගිවිසුමකට එළඹීමත් සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව හෙට්ටිපොල ජල සම්පාදන ක්‍රමයට අයත් ජල ටැංකිය හා ගොඩනැගිල්ල පිහිටි ඉඩම ජාතික ජල සම්පාදන මණ්ඩලයට බදු දීම සඳහා ගාස්තු තක්සේරු කිරීම සම්බන්ධයෙන් විධිමත් තක්සේරුවක් ලබා ගන්නා තුරු පත් කළ තාවකාලික තක්සේරු කමිටුවේ වාර්තාව අනුව මාසිකව රු.25,000.00 මුදලක් අය කිරීම සුදුසු බව පිළිගැනීමත්, ඒ අනුව කොන්දේසි සහිත ගිවිසුමකට එළඹීමත් සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

**07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ,එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම.**

**I. 2022 දෙසැම්බර් මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය)**
**උපලේඛන 01 සඳහා අනිත් පිට බලන්න.**

| අය විෂය අංකය | වැය විෂය නාමයන් | 1 පොදු පරිපාලනය | 2 සෞඛ්‍ය සේවා | 3 භෞතික සැලසුම් මංමාවත් ඉඩම් | 4 ජල සේවා | 5 වෙනත් උපයෝගී සේවා | 6 සුභසාධක සේවා | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | වැටුප් හා දීමනා | 2526430.10 | 1408773.25 | 1368275.00 | 43049.67 | 118830.42 | 2607664.73 | 8073023.17 |
| 2 | ගමන් වියදම් | 57176.49 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 57176.49 |
| 3 | සැපයුම් හා උපකරණ | 913660.92 | 1716630.00 | 1538909.10 | 7770.00 | 0.00 | 46950.00 | 4223920.02 |
| 4 | ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා හා නඩත්තුව | 720120.00 | 690115.00 | 658203.00 | 53010.00 | 668025.00 | 109500.00 | 2898973.00 |
| 5 | ප්‍රවාහන, සම්බන්ධතා ආවශ්‍යක හා වෙනත් සේවා | 1114240.59 | 319282.25 | 0.00 | 968061.89 | 92709.84 | 22353.79 | 2516648.36 |
| 6 | පොළී ගෙවීම්,ලාභාංශ හා ප්‍රසාද මුදල් | 0.00 | 0.00 | 21065.59 | 0.00 | 120.35 | 0.00 | 21185.94 |
| 7 | ආධාර මුදල් , දායක මුදල් හා සහනාධාර | 23290.50 | 8900.00 | 0.00 | 0.00 | 0.00 | 862008.75 | 894199.25 |
| 8 | විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 18618.09 | 49428.32 | 0.00 | 0.00 | 0.00 | 12357.08 | 80403.49 |
| | **පුනරාවර්ථන වැය එකතුව** | **5373536.69** | **4193128.82** | **3586452.69** | **1071891.56** | **879685.61** | **3660834.35** | **18765529.72** |
| | ප්‍රාග්ධන වියදම් | | | | | | | |
| 9 | ප්‍රාග්ධන වැය | 325916.00 | 394110.00 | 1652836.02 | 3322.00 | 1914100.00 | 534876.43 | 4825160.45 |
| 10 | ණය ආපසු ගෙවීම් | 0.00 | 0.00 | 272935.20 | 0.00 | 767.27 | 0.00 | 273702.47 |
| | ප්‍රාග්ධන වැය එකතුව | **325916.00** | **394110.00** | **1925771.22** | **3322.00** | **1914867.27** | **534876.43** | **5098862.92** |
| | පුනරාවර්ථන වැය හා ප්‍රාග්ධන වැය එකතුව | **5699452.69** | **4587238.82** | **5512223.91** | **1075213.56** | **2794552.88** | **4195710.78** | **23864392.64** |
| | තැන්පත් | 1461839.33 | | | | | | 1461839.33 |
| | වැට් | 0.00 | | | | | | 0.00 |
| | ජාතිය ගොඩනැඟීමෙ බද්ද | 0.00 | | | | | | 0.00 |
| | මුද්දර බද්ද | 0.00 | | | | | | 0.00 |
| | සේවක ණය | 561914.00 | | | | | | 561914.00 |
| | අත්තිකාරම් | 22220.00 | | | | | | 22220.00 |
| | ණයහිමි | 720950.20 | | | | | | 720950.20 |
| | සමුච්චිත අරමුදල | 0.00 | | | | | | 0.00 |
| | ආයෝජන | 0.00 | | | | | | 0.00 |
| | අගරු චෙක් | 1500.00 | | | | | | 1500.00 |
| | මුදල් මාරු | 0.00 | | | | | | 0.00 |
| | වෙනත් | 0.00 | | | | | | 0.00 |
| | **මුළු එකතුව** | **2768423.53** | | | | | | **26632816.17** |

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 දෙසැම්බර් මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල්.ඒ.විරාජ් මධුසංක විජේසිංහ මහතා - (එ.ජ.නි.ස.)</u>**

2022 දෙසැම්බර් මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.කමල්සිරි මහතා - (පො.ජ.පෙ.)</u>**

2022 දෙසැම්බර් මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 දෙසැම්බර් මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022 දෙසැම්බර් මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

**II. 2022 දෙසැම්බර් මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය)**
**උපලේඛන 02 සඳහා අනිත් පිට බලන්න.**

| අය විෂය නාමයන් | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැළසුම් මංමාවත්/ඉඩම් හා ගොඩනැගිලි | ජල සේවා | වෙනත් උපයෝගී සේවා | සුභ සාධක සේවා | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
| 10 වරිපනම් හා බදු | 58891.13 | 76200.00 | - | - | - | 46500.00 | 181591.13 |
| 20 කුලී | - | - | 939932.20 | - | 1157298.47 | 21000.00 | 2118230.67 |
| 30 බලපත්‍ර ගාස්තු | 4.00 | 8250.00 | - | - | - | 2400.00 | 10654.00 |
| 40 සේවා සඳහා ගාස්තු | 102000.00 | 692835.00 | 21530.00 | 47075.62 | - | 11895.00 | 875335.62 |
| 50 වරෙන්තු ගාස්තු හා දඩ | 0.00 | 0.00 | 18595.00 | 0.00 | 8489.85 | 1078.75 | 28163.60 |
| 60 වෙනත් ආදායම් | 130733.28 | 25935.00 | 4750.00 | 348451.39 | 233594.00 | 255.00 | 743718.67 |
| 70 වෙනත් ආධාර | 4926634.93 | 1198972.60 | 2904369.96 | 84880.00 | 275460.00 | 3363525.75 | 12753843.24 |
| **පුනරාවර්තන ආදායම් එකතුව** | **5218263.34** | **2002192.60** | **3889177.16** | **480407.01** | **1674842.32** | **3446654.50** | **16711536.93** |
| **ප්‍රාග්ධන ආධාර** | | | | | | | |
| 80 මූලධන ලැබීම් | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| පුනරාවර්තන ආදායම් හා ප්‍රාග්ධන ආදායම්වල එකතුව | **5218263.34** | **2002192.60** | **3889177.16** | **480407.01** | **1674842.32** | **3446654.50** | **16711536.93** |
| තැන්පත් | 1565138.51 | | | | | | 1565138.51 |
| වැට් | 0.00 | | | | | | 0.00 |
| ජා.ගො.බද්ද | 0.00 | | | | | | 0.00 |
| මුද්දර බදු | 106315.00 | | | | | | 106315.00 |
| සේවක ණය | 697231.50 | | | | | | 697231.50 |
| අත්තිකාරම් | 59245.00 | | | | | | 59245.00 |
| ණය ගැති | 121583.26 | | | | | | 121583.26 |
| සමු: අරමුදල | 0.00 | | | | | | 0.00 |
| ආයෝජන | 0.00 | | | | | | 0.00 |
| අගරු චෙක් | 1500.00 | | | | | | 1500.00 |
| මුදල් මාරු | 20000.00 | | | | | | 20000.00 |
| ශීර්ෂ බැර | 4740.00 | | | | | | 4740.00 |
| **මුළු එකතුව** | **2575753.27** | | | | | | **19287290.20** |

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 දෙසැම්බර් මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ **ලැබීම්** සාරාංශය) සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල්.ඒ.විරාජ් මධුසංක විජේසිංහ මහතා - (එ.ජ.නි.ස.)</u>**

2022 දෙසැම්බර් මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ **ලැබීම්** සාරාංශය) පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.කමල්සිරි මහතා - (පො.ජ.පෙ.)</u>**

2022 දෙසැම්බර් මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ **ලැබීම්** සාරාංශය) පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 දෙසැම්බර් මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ **ලැබීම්** සාරාංශය) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022 දෙසැම්බර් මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## II. 2022 දෙසැම්බර් මස මාසික වියදම් පුරෝකථන වාර්තාව

## උපලේඛන 03 සඳහා අනිත් පිට බලන්න.

| අනු අංකය | වැය ශීර්ෂය | වාර්ෂික වියදම් ඇස්තමේන්තුව | | | වියදම් පුරෝකථනය | | | වැය කල මුදල | | | අතිරික්තය/ඌනතාවය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අයවැය ලේඛනය | වැය ශීර්ෂ මාරු කිරීම / පරිපූරක | එකතුව | මාසය මුලදී | මාසය තුලදී | එකතුව | මාසය මුලදී | මාසය තුලදී | එකතුව | |
| 1 | වැටුප් දීමනා | 93270132.00 | 26058836.20 | 119328968.20 | 93270132.00 | 7772511.00 | 101042643.00 | 66002446.62 | 8073023.17 | 74075469.79 | 26967173.21 |
| 2 | ගමන් වියදම් | 1064000.00 | 244700.00 | 819300.00 | 1064000.00 | 99000.00 | 1163000.00 | 205600.00 | 57176.49 | 262776.49 | 900223.51 |
| 3 | සැපයුම් හා උපකරණ | 12265000.00 | 7294315.10 | 19559315.10 | 12288000.00 | 1800000.00 | 14088000.00 | 14781662.45 | 4223920.02 | 19005582.47 | 4917582.47 |
| 4 | ප්‍රග්ධන වත්කම් අළුත් වැඩියාව හා නඩත්තුව | 14040000.00 | 1720460.08 | 15760460.08 | 15180000.00 | 1060000.00 | 16240000.00 | 9078012.25 | 2898973.00 | 11976985.25 | 4263014.75 |
| 5 | ප්‍රවාහන සම්බන්ධතා , අවශ්‍යතා හා වෙනත් සේවා | 11474000.00 | 970050.84 | 12444050.84 | 11574000.00 | 1000000.00 | 12574000.00 | 7075776.18 | 2516648.36 | 9592424.54 | 2981575.46 |
| 6 | පොලී ගෙවීම් , ලාභාංශ සහ ප්‍රසාද මුදල් | 167360.00 | | 167360.00 | 154402.40 | 19173.03 | 173575.43 | 149452.37 | 21185.94 | 170638.31 | 2937.12 |
| 7 | ආධාර මුදල් ,දායක මුදල් හා සහනාධාර | 6138000.00 | 1715405.00 | 4422595.00 | 6188000.00 | 600000.00 | 6788000.00 | 1589956.98 | 894199.25 | 2484156.23 | 4303843.77 |
| 8 | විශ්‍රාම වැටුප් ,විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂිත | 968040.00 | | 978290.00 | 938040.00 | 80040.00 | 1018080.00 | 521334.74 | 80403.49 | 601738.23 | 416341.77 |
| 9 | උපකරණ වැය | 34425000.00 | | 34425000.00 | 34925000.00 | 2500000.00 | 37425000.00 | 2477436.99 | 4825160.45 | 7302597.44 | 30122402.56 |
| 10 | ණය ආපසු ගෙවීම් | 2196000.00 | | 2196000.00 | 1879858.83 | 261833.52 | 2141692.35 | 1343098.38 | 273702.47 | 1616800.85 | 524891.50 |
| | **එකතුව** | 176007532.00 | 10250.00 | 210101339.22 | 177461433.23 | 15192557.55 | 192653990.78 | 103224776.96 | 23864392.64 | 127089169.60 | 65564821.18 |

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 දෙසැම්බර් මස මාසික වියදම් පුරෝකථන වාර්තාව සහා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල්.ඒ.විරාජ් මධුසංක විජේසිංහ මහතා - (එ.ජ.නි.ස.)</u>**

2022 දෙසැම්බර් මස මාසික වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.කමල්සිරි මහතා - (පො.ජ.පෙ.)</u>**

2022 දෙසැම්බර් මස මාසික වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 දෙසැම්බර් මස මාසික වියදම් පුරෝකථන වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022 දෙසැම්බර් මස මාසික වියදම් පුරෝකථන වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## 08.රැස්වීම කැඳවීමේ දැන්වීමේ වෙනත් කාරණා කිසිවක් දක්වා ඇත්නම්, ඒ කරුණු එහි දක්වා ඇති අනුපිළිවෙලට හෝ විශේෂ හේතු නිසා ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරන අනුපිළිවෙලට - නැත.

න්‍යාය පත්‍රානුකූලව ගරු සභාවේ කටයුතු අවසන් වූ බවත් , 2023 වර්ෂයේ ජනවාරි මස මහ සභාවේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා දායක වූ සැමට ස්තූතිය පිරිනමන බවත්, ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.පෙ.ව.01.40 ට පමණ ගරු සභාවේ කටයුතු අවසන් කරන ලදී.

සටහන් කළේ -ඩබ්.එම්.එන්.ප්‍රියදර්ශනී, සංවර්ධන නිලධාරී.
වාර්තා කළේ -එච්.ඒ. ජී.නිශ්ශංක, ලේකම්, පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව